# ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංවිධාන

ආගමික මතවාදයන් හේතු කරගෙන ශ්‍රී ලංකාව තුළ
මුස්ලිම්වරු බෙදී ඇති ආකාරය විස්තර කෙරෙන සංක්ෂිප්ත වාර්ථාවකි

ධර්ම ගවේෂක
දේවරාජ් ෂාන් සිරාජ්
B.Sc ICT, MCS (SL)

සමාජ සංවාද
www.socialdialogues.org

# ශ්‍රී ලංකාවේ
# මුස්ලිම් සංවිධාන

# ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංවිධාන

ආගමික මතවාදයන් හේතු කරගෙන ශ්‍රී ලංකාව තුළ
මුස්ලිම්වරු බෙදී ඇති ආකාරය විස්තර කෙරෙන සංක්ෂිප්ත වාර්ථාවකි

ධර්ම ගවේෂක
දේවරාජ් ෂාන් සිරාජ්
B.Sc ICT, MCS (SL)

Copyright © 2019 by Islamic Information and Research Foundation

සියලු හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයකින් තොරව මෙම ප්‍රකාශනය හෝ එහි කොටසක් කිසිම අකාරයකින් ප්‍රතිනිෂ්පාදනය, යලි ප්‍රවේශ විය හැකි පද්ධතියක ගබඩා කොටතැබීම, කිසිම ආකාරයකින් බෙදා හැරීම සපුරා තහනම්ය.

ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදී

පළමු මුද්‍රණය 2020

ISBN 978-955-7933-13-9

ඉස්ලාමීය තොරතුරු හා ගවේෂණ පදනම
162/3, මැල්වත්ත, ඉළුකේවෙල, වැඋඩ

# පටුන


පෙරවදන vi
සංඥාපනය vii
හැඳින්වීම ix
මුස්ලිම්වරුන්ගේ ආගමනය හා බෙදී යෑම 1
සාම්ප්‍රදායික මුස්ලිම්වරු 3
ජමාත් අන්සාරිස් සුන්නතිල් මුහම්මදියා JASM 5
ශ්‍රී ලංකා තබ්ලීග් ජමාතය 8
ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි SLJI 10
සමස්ත ලංකා තෞහීද් ජමාත් ACTJ 12
ශ්‍රී ලංකා තෞහීද් ජමාතය SLTJ 13
ජමාතුස් සලාමා 15
ජාතික තව්හීද් ජමාතය NTJ 16
එක්සත් තව්හීද් ජමාතය UTJ 17
සිලෝන් තව්හීද් ජමාතය CTJ 18
සමස්ත ලංකා සලෆි කවුන්සිලය ACSC 19
ජමාතුල් මුස්ලිමීන් 20
සමස්ථ ලංකා තරීකතුල් මුෆ්ල්හීන් 21
අබ්දුර් රවුෆ් කණ්ඩායම 22
ක්වාරිජ්වරුන් 23
ෂියාවරුන් 24
කාදියානිවරුන් 25
ලංකාවේ මුස්ලිම් කණ්ඩායම් 26
සමස්ත ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය ACJU 27
ජාතික ශූරා කවුන්සිලය NSC 28
සමාප්තිය 29
උපග්‍රන්ථ අ : දේවධර්ම ගුරුකුල 30
උපග්‍රන්ථ ආ : නීතිවේද ගුරුකුල 31
මූලාශ්‍ර 32

# පෙරවදන

ෂාන් සිරාජ් විසින් රචිත "ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංවිධාන" නම් කෘතිය හේතු තුනක් නිසා කාලීන මෙහෙවරක් ඉටු කරයි. එනම් සිරාජ් පළමුව මුස්ලිම් ආගමික සංවිධාන ඔවුන්ගේ මතවාද හා නායකත්වය පිළිබඳ විස්තර කරන්නේය. දෙවනුව නිදහසින් පසු මුස්ලිම් භූ දර්ශනයේ පරිවර්තනයන් හඳුනා ගන්නේය. තෙවනුව මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන සමකාලීන ගැටළු හා අභියෝග පිළිබඳව පැහැදිලි කරන්නේය.

අදවන විට මුස්ලිම් ප්‍රජාව මුහුණ දෙන ඉහළම අභියෝගය වන්නේ රැඩිකල්කරනය සහ ත්‍රස්තවාදයයි. වෙනත් රටවල මෙන්ම, ශ්‍රී ලංකා මුස්ලිම් නායකයින් ඉස්ලාමයේ නාමයෙන් සිදුවන ප්‍රචණ්ඩත්වයේ අභියෝගයට 2019 අප්‍රේල් 21 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව අවදි වූහ. මෙම තත්වය බොහෝ දෙනෙක් එතෙක් ප්‍රතික්ෂේප කරමින් ජීවත් වූ අතර ස්වල්ප දෙනෙක් අදටත් ප්‍රතික්ෂේප කරමින් ජීවත් වෙති.

ශ්‍රී ලංකා මුස්ලිම් අනන්‍යතාවය හා එහි උරුමය ආරක්ෂා කරනවා වෙනුවට ප්‍රතිසංස්කරණවාදී, පුනර්ජීවන හා රැඩිකල් ව්‍යාපාර රහසිගතව හා ප්‍රසිද්ධියේ ශ්‍රී ලංකාව තුළට ඇතුල් වන විට ඔවුන් එය නොසලකා හැරියෝය. භයානකම ත්‍රස්ථවාදි සංවිධානයක් වන "ඉස්ලාමීය දේශය", ශ්‍රී ලංකාව තුළට ප්‍රවිෂ්ට වී ජාලගත වූ විදේශ මතවාද අතුරින් එකකි. ආගමික අවකාශය නියාමනය කිරීමට අපොහොසත් වීම දරුණුතම ත්‍රස්ත ප්‍රහාරයෙන් අවසන් විය. පස්චාත් නිදහස් ඉතිහාසයේ කිසිඳු ප්‍රහාරයක් මෙතරම් විනාශකාරී වී නොමැත. දශක ගණනාවක ආගමික, දේශපාලනික හා සංස්කෘතිමය රැඩිකල්කරනයන් සිදු කළ, ඉස්ලාමීය දේශය (Islamic State) සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාව තම මතවාදය ප්‍රගුණ කර සාමාජිකයන් බඳවා ගෙන ප්‍රහාරය දියත් කළේය.

මෙතෙක් ආදර්ශ පුරවැසියයෙකු වූ ලාංකිය මුස්ලිම්වරයා පිළිබඳව සමාජයේ පැවති ප්‍රතිරූපය එක රැයකින් වෙනස් විය. අද සිංහල හා දෙමළ ජනයාගෙන් බහුතරයක් මුස්ලිම්වරුන් දෙස බලන්නේ තම රටට, සෙසු පුරවැසියන්ට සහ විදේශීය අමුත්තන්ට හානි කිරීම සම්බන්ධයෙන් සැකයෙන්, අගතියෙන්, අමනාපයෙන්, කෝපයෙන් හා වෛරයෙන් බලති. ප්‍රහාරය සඳහා සාධක තුනක් බලපාන්නට විය. පළමුවැන්න, මුස්ලිම් ආගමික ව්‍යාපාර අතර පැවති අභ්‍යන්තර මතභේද. දෙවැන්න, මුස්ලිම් හා බෞද්ධ ව්‍යාපාර අතර පැවති අන්තර් ආගමික මතභේද. තුන්වැන්න, ආගමික සංවිධාන නියාමනය කිරීම සඳහා නීති, ආයතන හා යාන්ත්‍රණ ශ්‍රී ලංකාව තුළ නොමැතිකම. පාස්කු ඉරිදා සිදු වූ ප්‍රහාරයට වසරකට ආසන්න කාලයක් ගතවී ඇතත් මුස්ලිම් නායකයින් සහ ජාතික ආරක්ෂක ප්‍රජාව තර්ජනයේ ස්වභාවය තේරුම් ගෙන නොමැත. පාස්කු ඉරිදා ප්‍රහාරය තවත් එක් ප්‍රහාරයක් හෝ බටහිර කුමන්ත්‍රණයක් යැයි මුස්ලිම්වරු විශ්වාස කරන අතර, රජය තවමත් පැරණි යුද්ධයට එරෙහිව සටන් කිරීම සඳහා සිය මෙවලම් මුවහත් කරමින් සිටියි.

බුද්ධි අංශ, නීතිය බලාත්මක කිරීම සහ යුද හමුදා ප්‍රතිචාරය හේතුවෙන් ආසන්න ප්‍රහාරයක තර්ජනය අඩු වී ඇතත්, ත්‍රස්තවාදය, අන්තවාදය සහ අන්‍ය මත පිළිනොගැනීමේ තර්ජනය බොහෝ සෙයින් ජීවමාන ය. ශ්‍රී ලංකා රජය සහ එහි ප්‍රජා හවුල්කරුවන් විසින් මෙම තර්ජනය කළමනාකරණය කිරීමේ පළමු පියවර වන්නේ තර්ජනය තේරුම් ගැනීමයි. මුස්ලිම් ආගමික අවකාශය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මූලික ප්‍රතිචාරය ලැබිය යුත්තේ මුස්ලිම්වරුන්ගෙනි. එහෙත් නායකත්වයක් නොමැති නම් සහ මුස්ලිම්වරුන් අඛණ්ඩව අසමත් වුවහොත්, ආරක්ෂාව තහවුරු කිරීම රජයේ පරම වගකීමක් වන බැවින් මෙම විෂයට රජය මැදිහත් වනු ඇත. දේශපාලන, ආරක්ෂක අංශ, බුද්ධි අංශ සහ ප්‍රජා නායකයින් වැරැද්ද කුමක්දැයි වටහා ගැනීමට හා දැන ගැනීමට වෙහෙසෙති. ප්‍රවීණයන් පවා සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සහ පුනර්ජීවන ඉස්ලාමීය ව්‍යාපාර අතර වෙනස නොදනිති. ආගමික, දේශපාලන හා සංස්කෘතික භූ දර්ශනය ඔවුන් තේරුම් නොගන්නේ නම්, වරින් වර ඇති වන ත්‍රස්ත ප්‍රහාර සහ වාර්ගික පසුබෑම් තුළින් තර්ජනය දිගටම වර්ධනය වේ.

"ෂාන් සිරාජ් විසින් රචිත ශ්‍රී ලංකාවේ මුස්ලිම් සංවිධාන නම් කෘතිය ආරක්ෂාව සහ ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ කාලීන දැනුම හා අවබෝධය ලබා දෙයි. ප්‍රේමයේ ශ්‍රමයක් වන ඔහුගේ පොත සැලකිල්ලක් දක්වන සියලු ශ්‍රී ලාංකිකයන් විසින් කියවිය යුතු කෘතියකි"

ආචාර්ය රොහාන් ගුණරත්න

සිංගප්පූරුවේ නැන්යැන්ග් (Nanyang) තාක්ෂණික විශ්ව විද්‍යාලයේ ආරක්ෂක අධ්‍යයනය පිළිබඳ මහාචාර්යවරයා, "Three Pillars of Radicalization: Needs, Networks and Narratives" (Oxford University Press, 2019) ප්‍රකාශනයේ සමකර්තෘ

# සංඥාපනය

බහු ආගමික බහු වාර්ගික පවුලක හැදී වැඩුණු මා ඉස්ලාම් ධර්මය නිවැරදි ධර්මය යයි තීරණය කළ පසුව ධර්මය ඉගෙන ගැනීමේදී ලංකාවේ මෙන්ම ලෝකයේ සිටින විවිධ මුස්ලිම් කණ්ඩායම් ගැන තරමක් ගැඹුරට අධ්‍යයනය කිරීමට සිදු විය. විශ්වවිද්‍යාලයේ ගත කළ කාලය තුළ මේ සඳහා හොඳ අවකාශයක් මට ලැබුණි. විශ්වවිද්‍යාලය තුළ විවිධ මත දැරූ මුස්ලිම් මිතුරන් මා හට හමු වූ අතර එමඟින් මාගේ කුතුහලය තවදුරටත් වර්ධනය විය. එබැවින් විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේදී විවිධ මුස්ලිම් කණ්ඩායම් ඉදිරිපත් කරන මතවාද අතුරින් නිවැරදි මතවාදය කුමක්දැයි සෙවීම විශ්ව විද්‍යාල අධ්‍යාපනයට පරිබාහිර මාගේ ගවේෂණ ක්ෂේත්‍රයක් විය. විවිධ මුස්ලිම් කණ්ඩායම්වල පොත්පත්, ලිපි, දේශනා, ඔවුන් අනෙකුත් කණ්ඩායම් සමඟ සිදු කරන වාදවිවාද, එකිනෙකාගේ මතවාද වලට විරුද්ධව ලියන ලද ලිපි හා පවත්වන දේශන තුළින් බොහෝ මුස්ලිම් කණ්ඩායම් පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට මට හැකි විය. වසර 2013 වන විට අද ලංකාව තුළ පවතින ආගමික මතවාදයන් ප්‍රමුඛ කරගත් මුස්ලිම් කණ්ඩායම් සියල්ලක්ම පාහේ ක්‍රියාකාරීව තිබුණි. ඊට අමතරව වර්තමානයේදී කණ්ඩායම් අතලොස්සක් පමණක් අලුතින් බිහි වී ඇත.

මෙම කණ්ඩායම් පිළිබඳව විවිධ අදහස් සමාජයේ කතිකාවට ලක් වුවද ඔවුන් පිළිබඳව පැහැදිලි අවබෝධයක් පොදු ජනයා තුළ නොමැති බව මට හැඟී ගියේය. විශේෂයෙන් මෙම කණ්ඩායම් පිළිබඳව මුස්ලිම් නොවන සමාජයේ පවතින්නේ විශාල සැකයකි. එබැවින් දැනට පවතින මුස්ලිම් කණ්ඩායම් පිළිබඳව මාගේ ගවේෂණය කෙටියෙන් හා සරලව සමාජ ගත කිරීම කාලෝචිත යයි මට සිතුනි. මාගේ ගවේෂණය විධිමත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා මුස්ලිම් කණ්ඩායම් පිළිබඳව ලියැවුණු පර්යේෂණ පත්‍රිකා කිහිපයක්ද උපකාරකරගෙන ඇත්තෙමි.

මෙම පොත් පිංච දැනට ලංකාවේ පවතින මුස්ලිම් කණ්ඩායම් පිළිබඳව යම් හැඳින්වීමක් ලබා ගැනීමට උපකාරවනු ඇතැයි විශ්වාස කරමි.

දෙවිඳුනි! පාඨකයාගේ සිත් සත්‍යාවබෝධය කරා යොමු කරනු මැනව!!!

දේවරාජ් ෂාන් සිරාජ් B.Sc ICT, MCS (SL)
ප්‍රාරම්භකරු - ඉස්ලාමීය තොරතුරු හා ගවේෂණ පදනම

# හැඳින්වීම

අප ජීවත් වන ශ්‍රී ලංකාව යනු බහු වාර්ගික බහු ආගමික රටකි. එහි විවිධ ජාතීන් හා ආගමිකයන් ජීවත් වෙති. බහුතරයක් ජනයා සිංහල වන අතර යෝනක, දෙමළ, බර්ගර්, මැලේ යනාදී සුළු ජාතීන්ද ලංකාව තුළ ජීවත් වෙති. බහුතර ජනයා බෞද්ධ දර්ශනය අනුගමනය කරන අතර අන් අය කිතුනු, ඉස්ලාම්, හින්දු යන ආගම් පිළිපදිති.

ශ්‍රී ලාංකීය මුස්ලිම් නොවන ජනයා හමුවේ ලාංකීය මුස්ලිම්වරුන් යනු ඉස්ලාම් ධර්මය පිළිපදින එක් ජන කොටසක් යන පොදු හැඟීම තිබුණද යථාර්ථය ඊට හාත්පසින්ම වෙනස් ය. ලෝකයේ අනෙකුත් රටවල මෙන්ම ලංකාව තුළද මුස්ලිම්වරු යම් යම් ආගමික මතවාද නිසා බෙදී වෙන් වී සිටිති.

ඇතැම් මතවාද ලංකාවේ දිගු කාලයක් මුළුල්ලේ පැවතගෙන එන බැවින් එම මතවාද දරන මුස්ලිම්වරු සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් ලෙස හැඳින්වේ. මෙම සාම්ප්‍රදායික මතවාද ඉස්ලාම් ධර්මයට අනුකූල නොවන බව පවසමින් මුස්ලිම් සමාජයේ යම් ආධ්‍යාත්මික වෙනසක් ඇති කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණවාදී ආගමික-සමාජීය ව්‍යාපාර ලෙස කටයුතු කරන මුස්ලිම් සංවිධාන රාශියක්ද ලංකාව තුළ තිබේ. තවද යම් ආගමික මතවාදයක් මුල් කරගෙන හුදෙකලා වූ මුස්ලිම් කණ්ඩායම්ද ලංකාවේ සිටිති. මීට අමතරව ඉස්ලාමීය රාමුවෙන් දැඩි ලෙස ඉවත් වූ බවට ඉහත කණ්ඩායම් සියල්ල විසින් සලකනු ලබන කණ්ඩායම්ද සිටිති.

ආගමික මතවාද ප්‍රමුඛ කරගෙන ක්‍රියාත්මක වන මුස්ලිම් සංවිධාන වලට අමතරව සමාජ සුබ සාධන කටයුතු සඳහා වූ මුස්ලිම් සංවිධානද ශ්‍රී ලංකාව තුළ පවතියි. ඇතැම් සමාජ සුබ සාධන සංවිධාන යම් ආගමික මතවාදයක් ප්‍රමුඛ කර ගත් සංවිධානයකට අනුබද්ධව කටයුතු කරන අතර අනෙකුත් සුබ සාධන සංවිධාන හුදෙක් සමාජ සුබ සාධන කටයුතු වලට පමණක් සීමා වී ස්වාධීනව කටයුතු කරති. තවද විවිධ ආගමික සංවිධාන වල එකමුතුවක් ලෙස ක්‍රියා කරන මුස්ලිම් සංවිධාන කිහිපයක්ද ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා මුස්ලිම් ප්‍රජාවේ බෙදීමට ඍජුව බලපාන්නේ මුස්ලිම් සුබ සාධන සංවිධාන නොව ආගමික මතවාද ප්‍රමුඛ කරගෙන කටයුතු කරන සංවිධාන වේ. බොහෝ විට මෙම සංවිධාන අතර ඉස්ලාමීය නීතිවේදය පිළිබඳ මත ගැටුම් තිබෙන අතර ඇතැම් විට දේවධර්මයේ මූලික කරුණු වලින් ද ඔවුන් වෙන් වී සිටිති. මෙවන් මතභේද නිසා නිරතුරුවම මෙම සංවිධාන අතර වාදවිවාද පවතී. එක් සංවිධානයක සිටින විද්වතුන් අනෙකුත් සංවිධාන වල මතවාද ශාස්ත්‍රීයව විවේචනයට ලක් කරමින් පොත්පත් ලියති, දේශනා පවත්වති. මෙම අදහස් හුවමාරුව බොහෝ විට සුහදශීලීව සිදු වුවද, කලාතුරකින් ගැටුම්කාරී තත්ව වලටද මෙම මතභේද මඟ පාදා ඇත. කෙසේනමුත් ආගමික මතභේද නිසා ආගමික සංවිධාන අතර ගැටුම් ඇති කර ගැනීම කිසිසේත්ම අනුමත කළ නොහැක.

මුස්ලිම් සමාජයේ පවතින මතභේද සඳහා වූ පදනම ඉස්ලාම් ධර්මයේ කරුණු ශාස්ත්‍රීයව අධ්‍යයනය කරන කෙනෙකුට අවබෝධ කර ගත හැකි වුවද සාමාන්‍ය මුස්ලිම්වරයෙකුට හෝ මුස්ලිම් නොවන්නෙකුට එය අවබෝධ කරගැනීම ඉතා අසීරුය. කෙසේනමුත් ලාංකීය මුස්ලිම් ප්‍රජාවේ දැනට පවතින බෙදීම පිළිබඳව යම් අවබෝධයක් ලබා ගැනීම කාලීන අවශ්‍යතාවයකි. එබැවින් ලංකාවේ ක්‍රියාත්මක වන ආගමික මතවාද මුල් කරගත් මුස්ලිම් කණ්ඩායම් වල මූලික මතවාද ඇතුළු අනෙකුත් විස්තර හා එම කණ්ඩායම් නිසා සිදු වී ඇති ආගමික-සමාජීය බලපෑම් පිළිබඳ සංක්ෂිප්ත වාර්ථාවක් මෙම පොත් පිංචයේ අන්තර්ගත වී ඇත. මෙහිදී මෙම කණ්ඩායම් පිළිබඳ මධ්‍යස්ථ විග්‍රහයක් ඉදිරිපත් කර ඇති අතර මෙම කණ්ඩායම් අතුරින් ඉස්ලාමයට අනුකුල වන්නේ කවුරුන්ද? ඉස්ලාමයෙන් දුරස්වන්නේ කවුරුන්ද? යන්න සාකච්ඡා කිරීම මෙම පොත් පිංචයේ අරමුණ නොවේ.

# මුස්ලිම්වරුන්ගේ ආගමනය හා බෙදී යෑම

ශ්‍රී ලංකාව යනු ඈත අතීතයේ සිටම විවිධ රටවල් සමඟ සම්බන්ධකම් පැවත්වූ රටකි. පෙරදිග මුතු ඇටය යයි හැඳින් වූ ශ්‍රී ලංකාව පෙර අපර දෙදිග යා කරන ව්‍යාපාරික කේන්ද්‍රස්ථානය විය. මේ නිසා ඈත අතීතයේ සිටම අරාබි, පාර්සියානු හා ඉතියෝපියානු වෙළඳුන් ලංකාවට පැමිණ ඇත. මේ සියලු ජාතිකයින් අරාබි භාෂාව කතා කළ නිසා පොදුවේ අරාබිවරුන් යයි හැඳින්විය හැකිය. මෙම අරාබිවරුන් ලංකාවට පැමිණ අවාහ විවාහ කර ගනිමින් ලාංකීය ජනයා සමඟ මිශ්‍ර වී තම ජනාවාස පිහිටුවාගෙන ඇති අතර යෝනකයන් ලෙස හැඳින්වෙන්නේ මෙම අරාබිවරුන් බව ඇතැම් විද්වතුන් පවසති [1]. ලංකාවේ ජනාවාස පිහිටුවා ගත්තා සේම අරාබිවරුන් ඉන්දියාවේ මුහුදුබඩ පෙදෙස් වල ද ජනාවාස පිහිටුවාගෙන ඇත. මෙම ඉන්දු-අරාබි ජනයා ලංකාව සමඟ සමීප සම්බන්ධකම් පවත්වා ඇති බව ප්‍රකට කරුණකි.

ක්‍රි.ව 7 වන සියවසේදී මුහම්මද් ﷺ තුමා තම ධර්මය දේශනා කල පසු ක්‍රමයෙන් අරාබිවරුන් මුහම්මද් ﷺ තුමාගේ ධර්මය වැළඳ ගත්හ. අරාබිවරුන් හා ලංකාව අතර තිබුණු සම්බන්ධකම් නිසා අරාබිවරුන් වැළඳගත් ඉස්ලාම් ධර්මය ක්‍රමයෙන් ලාංකීය යෝනක ප්‍රජාවට ප්‍රවිෂ්ට විය. ඉන්දු-අරාබි ප්‍රජාවටද ඉස්ලාමය ප්‍රවිෂ්ට වූයේ මේ අයුරිනි. ඉන්දු-අරාබි ප්‍රජාව හා ලංකාව අතර තිබුණු සම්බන්ධකම්ද ලංකාවට ඉස්ලාම් ධර්මය ප්‍රවිෂ්ට වීමට තවත් හේතුවක් විය. "හම්බන්කාරයින්" යනු ඉන්දියාවෙන් ලංකාවට සංක්‍රමණය වූ ඉන්දු-අරාබි ප්‍රජාවයි. ලංකාවේ යෝනකයන් හා හම්බන්කාරයින් යන දෙපිරිසම නැව් වලින් මෙරටට පැමිණි නිසා ඒ දෙපිරිසම හැඳින්වීමට මරක්කලයෝ යන නම භාවිතා වී ඇත [2]. මෙලෙස ක්‍රි.ව 9 වන සියවසේ සිට මුස්ලිම්වරුන් ලංකාවේ ජනාවාස පිහිටුවා ගනිමින් ක්‍රමයෙන් ව්‍යාප්ත වූහ.

19 වන සියවස වන විට ලංකාවේ ජීවත් වූ මුස්ලිම්වරුන්ගේ ඇදහිලි හා විශ්වාස සැලකීමේදී අති බහුතරයක් සූෆි මතවාදය අනුගමනය කළහ. දේව වේදයෙන් අශාරි, මාතුරූදී ගුරු කුල අනුගමනය කල අතර නීතිවේදය සඳහා වැඩි පිරිසක් ශාෆි ගුරු කුලයද සුළු පිරිසක් හනෆි ගුරු කුලයද අනුගමනය කළහ. මියගිය මුස්ලිම් සාන්තුවරුන්ගේ පිහිට පැතීම ප්‍රධාන ඇදහිලි ක්‍රමයක් ලෙස තිබුණි. තවත් විවිධ ඇදහිලි ක්‍රම මොවුන් සතු විය. සම්ප්‍රදායික මුස්ලිම්වරුන් යයි හැඳින්වෙන්නේ මෙම මතවාද අදටත් පිළිගන්නා පිරිසයි. 19 වන සිය වසේදී ඉන්දියාවේ බිහි වූ කාදියානිවරුන්ගෙන් සුළු පිරිසක්ද ඒ වන විට ලංකාවට පැමිණ ජීවත් වූ අතර ඔවුන් මුහම්මද් ﷺ තුමාට පසුව දේව පණිවිඩකරුවෙකු විශ්වාස කරන බැවින් ඉස්ලාම් ධර්මයෙන් පිටවූවන් බව සමස්ත මුස්ලිම් ප්‍රජාවම පිළිගනිති. තවද මැලේ, මේමන් හා බෝරා යන ජන කොටස්ද 19 සියවස  වන විට ලංකාවට සංක්‍රමණය වී ඇත.

---

*ලාංකීය මුස්ලිම්වරුන්ගේ ඉතිහාසය ගැන ගැඹුරින් අධ්‍යයනය කිරීමට ලෝනා දේවරාජා මහත්මිය විසින් රචිත "ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු", ආසිෆ් හුසෙන් විසින් රචිත "සෙරන්ඩිබ්", අචාර්ය එම්.ඒ.එම් ශුක්රි විසින් රචිත "ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු", එම්.ඒ.එම් අමීන් විසින් රචිත "ලාංකීය මුස්ලිම්වරු" නමැති කෘතීන් ඉතා ප්‍රයෝජනවත් වේ.

මෙලෙස ජීවත් වූ මුස්ලිම්වරුන් සැබවින්ම නිවැරදි ඉස්ලාම් ධර්මය පිළිනොපදින බවත් ඔවුන් සතුව ඉස්ලාමයට පටහැනි බොහෝ මතවාද තිබෙන බවත් මළවුන් ඇදහීම් ඇතුළු තවත් මිත්‍යා දෘෂ්ටික විශ්වාස නිසා ඔවුන් බහු දේවවාදයට තල්ලු වී ඇති බවත් පවසමින් මෙම දුර්මාර්ගයෙන් මුස්ලිම් ජනයා මුදවා පිවිතුරු ඉස්ලාම් ධර්මයට ප්‍රවිෂ්ට කිරීමේ අරමුණින් විවිධ ප්‍රතිසංස්කරණවාදී ඉස්ලාමීය සංවිධාන මූලික වශයෙන් ක්‍රි.ව 1940 ගණන් වලින් පසුව ලංකාව තුළ බිහි වී ඇත. මෙම ප්‍රතිසංස්කරණවාදී සංවිධාන සඳහා වූ පදනම් මතවාද අරාබිය, ඊජිප්තුව හා ඉන්දියාව වැනි රටවල් වලින් ලංකාව තුළට ප්‍රවිශ්ට වී ඇත. සමාජය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රමවේදය අනුව ප්‍රතිසංස්කරණවාදී සංවිධාන අතර මතභේද පවතියි. එනම් සමාජ ප්‍රතිසංස්කරණය සඳහා උපයෝගී කරගන්නා ක්‍රමවේදය ඉස්ලාමයට අනුකූලද නැද්ද යන සංවාද මෙම ප්‍රතිසංස්කරණවාදී සංවිධාන අතර නිරතුරුවම ඇත.

සම්ප්‍රදායික හා ප්‍රතිසංස්කරණවාදී මත අතුරින් නිවැරදි මතය කුමක්ද යන්න සාකච්ඡා කිරීම මෙම පොත් පිංචයේ අරමුණ නොවන අතර එවන් සාකච්ඡාවක් සඳහා ඉස්ලාම් ධර්මය පිළිබඳ ගැඹුරු දැනුමක් අවශ්‍ය වේ.

ලංකාවේ ක්‍රියාත්මක වන මුස්ලිම් සංවිධාන අතුරින් සියල්ලක්ම පාහේ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දේපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති සංවිධාන වේ [3].

# සාම්ප්‍රදායික මුස්ලිම්වරු

ලංකාවේ සාම්ප්‍රදායික මුස්ලිම්වරු යනු සූෆි මතවාදය අනුගමනය කරන පිරිසකි. එබැවින් සාම්ප්‍රදායික මුස්ලිම්වරු හැඳින්වීමට "සූෆිවරුන්" යන නමද භාවිතා වේ. සූෆි මතවදායට අනුව කෙනෙකුට පත්විය හැකි "හකීකත්" (අභ්‍යන්තර සත්‍යය) නම් ඉහළ අධ්‍යාත්මික තලයක් තිබෙන අතර මෙම අධ්‍යාත්මික තලයට පිවිසීම සඳහා විවිධ අධ්‍යාත්මික නායකයින් විවිධ අධ්‍යාත්මික මාර්ග (තරීකා) පෙන්වා දී ඇත. ලංකාවේ සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් ඔවුන් අනුගමනය කරන අධ්‍යාත්මික මාර්ගය (තරීකාව) අනුව කොටස් කිහිපයකට බෙදී සිටිති. එබැවින් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ට "තරීකාවරුන්" යැයිද පවසනු ලැබේ.

- කාදිරිය්යා
- ශාතුලීයා
- රිඵයීයා
- චිස්තීයා
- නක්ෂබන්දියා

සාම්ප්‍රදායික මුස්ලිම්වරු විවිධ තරීකාවලට බෙදී සිටියද ඔවුන් සියල්ල ඔවුන්ව හඳුන්වාගනු ලබන්නේ "සුන්නතුල් ජමාත්" ලෙසය. මොවුන් අශ්අරි හෝ මාතුරුදී යන දේවධර්ම ගුරු කුල අනුගමනය කරන අතර ශාෆි, හනෆි යන නීතිවේදී ගුරු කුල අනුගමනය කරති. තවද උතුරු ඉන්දියාවේ බරේලවි නම් නගරයේ සිටි අහමඩ් රීzසා කාන් (ක්‍රි.ව 1856-1921) නමැති ශාස්ත්‍රඥයාගේ ඉගැන්වීම් මත ගොඩනැගුණු බරේලේවි ලෙස පසුව ප්‍රකට වූ ආගමික ව්‍යාපාරයේ මතවාද ලාංකීය සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් අතර දැක ගත හැකිය. එබැවින් ලාංකීය සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් හැඳින්වීමට "බරේලේවිවරුන්" යන නම ප්‍රතිසංස්කරණවාදී මුස්ලිම් සංවිධාන උපයෝගී කරති. සාම්ප්‍රදායික මතවාද අනුගමනය කරන මුස්ලිම් සංවිධාන රාශියක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇත.

සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සතුව මූලික වශයෙන් මියගිය ආගමික සාන්තුවරුන් ඇදහීමේ ක්‍රමවේදයක් තිබේ. තමන්ගේ අවශ්‍යතා මෙම මියගිය ආගමික සාන්තුවරයාට කන්නලව් කරන අතර ඇතැම් විට තම අවශ්‍යතා පිළිබඳ දෙවිඳුන්ට කන්නලව් කරන අයුරින්ම මෙම මියගිය සාන්තුවරුන්ගෙන් ඉල්ලති. මොවුන් මෙලෙස මියගිය ආගමික සාන්තුවරුන් භූමිදානය කර ඇති තැන් මත සොහොන් කොත් ඉදි කර එම ස්ථානයේ විවිධ ඇදහිලි ක්‍රම පවත්වාගෙන යති. මෙවන් සොහොන් කොත් ලංකාවේ විවිධ ස්ථාන වල දැක ගත හැකිය. නිදසුන් ලෙස බලංගොඩ කුරගල ප්‍රදේශයේ පිහිටි දෆ්තාර් ජයිලානි පුදබිම [4], ගොඩපිටියේ එකීර් මුහියද්දීන් පල්ලිය, කල්මුනේ වෙරළ පල්ලිය හා දෙවටගහ පල්ලිය යන ස්ථාන වල පිහිටි සොහොන් කොත් නම් කළ හැකිය.

සමනළ කන්දේ පිහිටා ඇත්තේ ආදම් තුමාගේ පා සළකුණ බවත් ආදම් තුමාගේ හා ඔහුගේ බිරිඳ වන හව්වා තුමියගේ දේහ භූමිදානය කර ඇත්තේ ලංකාවේ බවත් ඇතැම් සාම්ප්‍රදායික මුස්ලිම්වරු විශ්වාස කරති [5].

දෙවිඳුන් යැදීම සඳහා ආරාබි බසින් වූ විවිධ සමූහ බැති ගී මොවුන්ගේ ඇදහිලි ක්‍රම වල විශේෂයෙන් දැකිය හැක. සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් අතුරින් ඇතැමුන්ගේ යාග ක්‍රම වල ශරීරයට පිහියෙන් ඇන ගැනීම, තුවාල කරගැනීම යන චාරිත්‍රද පවතියි. සාමූහික නර්තන තුළින් දෙවිඳුන්ට යාඥා කිරීමද මොවුන්ගේ වැදගත් ඇදහිලි ක්‍රමයකි. තවද විවිධ යන්ත්‍ර මන්ත්‍ර උපයෝගී කර ගනිමින් ආරක්ෂක ක්‍රම ඇති කර ගැනීම හා කොඩිවින කැපීම වැනි විශ්වාසයන්ද ඇතැම් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සතුව අධික වශයෙන් පවතියි. මිය ගිය සාන්තුවරුන්ගේ නාමයෙන් දෙන "කන්දූරි" නම් දාන මංගල්‍යයන් කොඩියේට්‍රම් (පල්ලියේ කොඩිය එසවීම) හා මව්ලූද් සැමරීම (ගීතිකා මඟින් මුහම්මද් ﷺ තුමාණන්ගේ ගුණ ගායනය) යනාදී චාරිත්‍රද සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සතුව පවතියි. තවද සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ විවාහ ක්‍රමයේ මූලික වශයෙන් මනමාලියගෙන් දෑවැද්ද ඉල්ලීමේ චාරිත්‍රයක්ද පවතියි. සම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවන්ගේ අතීත ඇඳුම් බොහෝ විට සාරිය වුවද වත්මන් සාම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවන් පවා අබායා* ඇඳුමට නැඹුරු වී ඇති බව පෙනෙන්නට තිබේ.

* "අබායා" යනු මූලික වශයෙන් මැදපෙරදිග රටවල හා අනෙකුත් රටවල මුස්ලිම් කාන්තාවන් තම මුලු ශරීරයම වැසෙන පරිදි අඳින ලොගුවක් මෙන් වූ ඇඳුමකි.

# ජමාත් අන්සාරිස් සුන්නතිල් මුහම්මදියා JASM

ප්‍රතිසංස්කරණවාදී ආගමික-සමාජීය ව්‍යාපාර ලෙස කටයුතු කරන මුස්ලිම් සංවිධාන අතුරින් පළමුව ස්ථාපිත කර ඇති සංවිධානය වනුයේ ජමාත් අන්සාරිස් සුන්නතිල් මුහම්මදියා නම් වූ සංවිධානය යි. සෞදි අරාබියේ සිදු වූ ආගමික-සමාජීය ප්‍රතිසංස්කරණය තුළින් මුස්ලිම් සමාජයට සිදු වන යහපත ගැන පැහැදුණු අබ්දුල් හමීඩ් අල් බක්රි (දර්වේස් හාජියාර්) නමැති ලාංකිකයා ලංකාව තුළද එම ප්‍රතිසංකරණ ව්‍යාපාරය 1940 වන වසරේදී පමණ ආරම්භ කර ඇත. ක්‍රි.ව 1947 දී කුරුණෑගල දිස්ත්‍රික්කයේ පරගහදෙනිය නම් ප්‍රදේශයේ මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය සඳහා ජමාත් අන්සාරිස් සුන්නතිල් මුහම්මදියා යන සංවිධානය ස්ථාපිත කර ඇති අතර මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යාලයද එහිම පිහිටා තිබේ. මෙම සංවිධානය මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංවිධානයකි (MRCA/13/6/KU/08). තවද මෙම සංවිධානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 2009 අංක 59 දරණ පනත මගින් සංස්ථාගත කර ඇත. වර්තමානයේදී මොවුන්ගේ ශාඛාවන් ලංකාවේ විවිධ පෙදෙස් වලට ව්‍යාප්ත වී තිබේ. මොවුන් අතර සිංහල බස හෝ ඉංග්‍රීසි බස කතා කරන ප්‍රචලිත විද්වතුන් නොමැති නිසා මෙම ව්‍යාපාරයේ මතවාදය පිළිබඳ මුස්ලිම් නොවන ජනයාට ප්‍රමාණවත් දැනුමක් නොමැත.

මුස්ලිම් සමාජය ප්‍රතිසංස්කරණය සඳහා මොවුන් අනුගමනය කරන මූලික ක්‍රමවේදය වනුයේ නිවැරදි දේවධර්මය හා ඉස්ලාමීය නීතිවේදය වෙත මුස්ලිම් ජනයා අරාධනා කිරීමයි. අශ්අරි හා මාතුරූදී යන දේවධර්ම ගුරු කුල වලට විරුද්ධ වන මොවුන් මුහම්මද් ﷺ තුමාගේ සහගාමීන් ඇතුළු එතුමාට පසුව පැමිණි පරම්පරා තුනෙහි සිටි බැතිමත් මුතුන්මිත්තන්ගේ (සලෆිවරුන්ගේ) දේවධර්මය අනුගමනය කරති. නීතිවේදය සැලකීමේදී එක් ගුරු කුලයකට සීමා නොවන අතර ඉස්ලාමීය නීතිරීති ඉස්ලාමීය මූලාශ්‍ර වන අල් කුර්ආනයෙන් හා මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම්වලින් ඍජුවම ලබා ගනිති.

සූෆි මතවාදය ඉස්ලාමයට පටහැනි බව මොවුන් පවසති. සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සතුවූ මිය ගිය සාන්තුවරුන්ගෙන් පිහිට පැතීමේ ඇදහිලි ක්‍රමය මොවුන් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරති. එය ඒකදේව විශ්වාසයට පටහැනි බහු දේවවාදී විශ්වාසයක් යයි මොවුන් පවසති. මිය ගිය සාන්තුවරුන්ගෙන් පිහිට පැතීමේ ඇදහිලි ක්‍රමය තුළින් අල්ලාහ්ට ආදේශ තැබීමේ මහා පාප කර්මය සිදු වන බව මොවුන් පවසති. තවද සාන්තුවරුන් මියගිය ස්ථාන මත සොහොන් කොත් ඉදි කිරීම මුහම්මද් ﷺ තුමා දේශනා කළ පිවිතුරු ඉස්ලාම් ධර්මයට පටහැනි බව මොවුන්ගේ මතයයි. මෙම මතවාදය ක්‍රි.ව 1703 - 1792 යන කාල වකවානුවේ අරාබිකරයේ විසූ මුහම්මද් ඉබ්නු අබ්දුල් වහාබ් (අබ්දුල් වහාබ්ගේ පුත් මුහම්මද්) නමැති ශාස්ත්‍රඥයා දේශනා කළ ප්‍රතිසංස්කරණ මතවාදයම විය. එබැවින් මෙම මතවාදය දරන්නන් හැඳින්වීමට "වහාබිවරුන්" යන නම සාම්ප්‍රදායික/සූෆි මුස්ලිම්වරුන් භාවිතා කරති.

මළවුන් ඇදහීම බහුදේව විශ්වාසයක් බව මොවුන් දැඩි ලෙස පවසන නිසා මොවුන් ඒකදේවවාදය දේශනා කරන පිරිසක් යන අරුතින් තව්හීද් සංවිධානයක් යයි ලංකාව තුළ ප්‍රචලිත ය. තව්හීද් යන්නේ අදහස් වන්නේ දෙවිඳුන්ගේ ඒකීයත්වය පිළිගැනීමයි. කෙසේනමුත් මෙම සංවිධානයට පසුව බිහි වූ ඇතැම් තව්හීද් සංවිධාන හා මොවුන් අතර ඉස්ලාම් ධර්මය අවබෝධ කරගැනීමේ ක්‍රමවේදයේ මූලික වෙනස්කම් තිබේ. එනම් මොවුන් ඉස්ලාම් ධර්මය අවබෝධ කර ගැනීම සඳහා මුහම්මද් ﷺ තුමාගෙන් පසු ජීවත් වූ පරම්පරා තුනෙහි සිටි ශ්‍රේෂ්ඨ විද්වතුන්ගේ ආගමික තීන්දු තීරණ වලට ප්‍රමුඛත්වය දී කටයුතු කරති. තවද යම් යම් විෂයයන් වලදී විද්වතුන්ගේ ඒක මතික තීරණයට (ඉජ්මා) ප්‍රමුඛත්වක් දී කටයුතු කරති. මෙම ක්‍රමය පසුව බිහි වූ ඇතැම් තව්හීද් සංවිධාන සතුව නොමැත. එබැවින් නූතන තව්හීද් කණ්ඩායම්වලින් JASM මතවාදය දරන්නන් වෙන්කර හැඳින්වීම සඳහා සලෆිවරුන් යන නම භාවිතා කළ හැකිය.

මොවුන් සාම්ප්‍රදායිකව මුස්ලිම් සමාජය සතුව පැවතුනු බොහෝ ඇදහිලි ක්‍රම හා සම්ප්‍රදායන් ඉස්ලාමයට පටහැනි මිත්‍යා විශ්වාස මත පදනම් වූ ඇදහිලි ක්‍රම බව පවසති. ඇතැම් ඇදහිලි ක්‍රම මිත්‍යාව මත පදනම් නොවුනද ඒවා ආගමික මූලාශ්‍ර වල නොමැති බව පවසති. මෙලෙස ආගමේ නාමයෙන් බිහි වූ නවාංග වලින් මුස්ලිම් ජනයා මුදවා ගැනීමද මොවුන්ගේ ව්‍යාපාරයේ විශේෂ කාර්යයක් වේ.

තවද සාම්ප්‍රදායික මුස්ලිම් කාන්තාවන්ට විවිධ අසාධාරණකම් සිදු වන බවත් එයට විසඳුමක් ලෙස සමාජයේ විශාල වෙනසක් සිදු විය යුතු බවත් මොවුන් පවසති. මූලික වශයෙන් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් සතු දැවැදි ක්‍රමය අහෝසි විය යුතු බව මොවුන් දැඩි ලෙස අවධාරණය කරති. මුස්ලිම් කාන්තාවන් පල්ලියට පැමිණ නමස්කාර කිරීම සඳහා පහසුකම් සකසා දිය යුතු බව මොවුන් පවසති. මුස්ලිම් කාන්තාවන් මුහුණ වැසීම යන විෂයේදී මොවුන්ගේ බහුතර මතය එය අනිවාර්ය නොවන බවයි. නමුත් ඉතා සුළු විද්වත් පිරිසක් එය අනිවාර්ය වේ යන මතය දරති.

ක්‍රි.ව 1924 දී බිඳ වැටුණු ඉස්ලාමීය අධිරාජ්‍ය (කිලාෆතය) නැවත බිහි කරන්නේ කෙසේද යන ප්‍රශ්නයේදී එසේ ඉස්ලාමීය අධිරාජ්‍යයක් බිහිවීමට නම් ඒ සඳහා අවශ්‍ය වනුයේ නිවැරදි දේවධර්මය හා නීතිවේදය අනුගමනය කිරීම තුළින් පිවිතුරු ඉස්ලාම් ධර්මය පිළිපදින මුස්ලිම් සමාජයක් බිහි කිරීම විනා බලෙන් ඉස්ලාමීය අධිරාජ්‍යයක් ලොව ස්ථාපිත කිරීම නොවන බව JASM මතධාරීන් අවධාරණය කරති. එබැවින් ඉස්ලාමීය අධිරාජ්‍යය පිළිබඳ සංකල්පය මුල්කරගෙන මොවුන්ගේ වැඩ කටයුතු සිදු නොවන අතර ලාංකීය දේශපාලනය ගැන මොවුන් තුළ වැඩි සැලකිල්ලක් නොමැත. ලොව පවතින නොයෙකුත් දේශපාලන දෘෂ්ටි වල විවිධ සංකල්ප න්‍යායාත්මකව ප්‍රතික්ෂේප කළද ප්‍රායෝගික තලයේදී ශ්‍රී ලංකාවේ පවතින ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයට අනුකූලව මුස්ලිම් ජනයා කටයුතු කළ යුතු බව මොවුන්ගේ ස්ථාවරයයි.

මෙම ව්‍යාපාරයේ ප්‍රාරම්භකයා වන අබ්දුල් හමීඩ් අල් බක්රි නැමැත්තා විසින් ආරම්භ කර ඇති "උන්මෛ උදයම්" (සත්‍යෝදය) නමැති දෙමළ බසින් ලියවෙන ඉස්ලාමීය සඟරාව අද දක්වා ප්‍රකාශයට පත්කරනු ලැබේ. මෙම සඟරාව ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ QD/160/News/2019 යන අංකය යටතේද ලංකා ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ISSN 1391-7501 යන අංකය යටතේද ලියාපදිංචි කර ඇති මෙම සඟරාව මාසිකව මුද්‍රණය කරනු ලබන නීත්‍යානුකූල සඟරාවකි. (www.unmaiudayam.com)

JASM සංවිධානය ආගමික කටයුතු වලට අමතරව, විශාල වශයෙන් සමාජ සුභ සාධන සේවා වල යෙදී සිටින සංවිධානයකි. මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.jasm.lk) තුළින් දැන ගත හැකිය.

# ශ්‍රී ලංකා තබ්ලීග් ජමාතය

ලංකාව තුළ ක්‍රියාත්මක වන තවත් ප්‍රතිසංස්කරණවාදී මුස්ලිම් සංවිධානයක් වනුයේ ශ්‍රී ලංකා තබ්ලීග් ජමාතය නම් සංවිධානයයි. ඉන්දියාවේ දේවබන්දි ව්‍යාපාරයේ සාමාජිකයකු වූ ඉලියාස් මවුලානා විසින් මුස්ලිම්වරුන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තබ්ලීග් ජමාතය ස්ථාපිත කරන ලදී. මෙම ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සංවිධානයක් ලෙස ක්‍රියා කරනුයේ ක්‍රි.ව 1950 වන වසරට පසුවය. ශ්‍රී ලංකා තබ්ලීග් ජමාතය ශ්‍රී ලංකාවේ නිල වශයෙන් ලියාපදිංචි වී නොමැති නමුත් ලංකාවේ බොහෝ ප්‍රදේශ වල ව්‍යාප්ත වී ඇති ක්‍රියාකාරී සංවිධානයකි. මොවුන්ගේ මූලස්ථානය (මර්කසය) කොළඹ පිහිටා ඇත. වර්තමානයේදී මෙම තබ්ලීග් ජමාතයට පූර්ණ අනුග්‍රහය දක්වන්නේ සමස්ත ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය (ACJU) නම් සංවිධානයයි. ACJU සංවිධානයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා හසුරවන විද්වත් පිරිසක් සිටින බැවින් ලාංකීය මුස්ලිම් නොවන ජනයා අතර තබ්ලීග් ජමාත් සංවිධානයේ මතවාදයන් ක්‍රියාකාරී අයුරින් සමාජ ගත වී ඇත.

මුස්ලිම් ජනයා නැමදුමට යොමු කිරීම තුළින් යහපත් මුස්ලිම් සමාජයක් බිහි කිරීම ඔවුන්ගේ ප්‍රතිසංස්කරණවාදී ක්‍රමවේදයයි. මුස්ලිම් ජනයාගේ ගෙයින් ගෙට ගොස් ඉස්ලාමීය නැමදුමේ වැදගත්කම කියා දෙමින් මුස්ලිම්වරුන් නැමදුම කරා කැඳවති. මොවුන්ගේ ප්‍රධාන කටයුත්තක් වනුයේ නිවසෙන් බැහැර වී දින 3,40 හෝ මාස හතරක් විවිධ පල්ලිවල ලැගුම් ගෙන ආගමික කටයුතු වල නිරත වීම හා එම ප්‍රදේශයේ මුස්ලිම්වරුන් හමු වී නැමදුමට ආරාධනා කිරීමයි. තවද බ්‍රහස්පතින්දා දිනවල රාත්‍රී කාලය යම් පල්ලියක ගත කර නැමදුම් වල නිරත වීමද ඔවුන්ගේ සුවිශේෂී කටයුත්තකි.

කෙසේනමුත් මොවුන් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන්ගේ දේවධර්ම ගුරු කුල වලට හෝ නීතිවේද ගුරු කුල වලට විරුද්ධ නොවෙති. එබැවින් තබ්ලීග් ජමාතයේ දේවධර්ම ගුරු කුලය අශ්අරී හෝ මාතුරුදී වන අතර නීතිවේද ගුරු කුල අතුරින් ශාෆි ගුරු කුලයට ප්‍රධාන තැනක් දී ඇත.

මළගිය මුස්ලිම් සාන්තුවරුන් ඇදහීම යන ප්‍රධාන සාම්ප්‍රදායික ඇදහිලි ක්‍රම ඇතුළු අනෙකුත් බොහෝ සාම්ප්‍රදායික ඇදහිලි ක්‍රම න්‍යායාත්මකව ප්‍රතික්ෂේප කළද ඒවාට ප්‍රසිද්ධියේ විරුද්ධ නොවීම ශ්‍රී ලංකා තබ්ලීග් ජමාතයේ ලක්ෂණයකි. එබැවින් තබ්ලීග් ජමාතයේ ඇතැම් සාමාජිකයන් සතුව මළගිය මුස්ලිම් සාන්තුවරුන් ඇදහීම ඇතුළු අනෙකුත් සාම්ප්‍රදායික ඇදහිලි ක්‍රම තවමත් පවතියි. එබැවින් මළගිය මුස්ලිම් සාන්තුවරුන් ඇදහීම හා සාම්ප්‍රදායික ඇදහිලි ක්‍රම ප්‍රතික්ෂේප කරන අනෙකුත් මුස්ලිම් සංවිධාන තබ්ලීග් ජමාතයේ ප්‍රතිසංස්කරණ ක්‍රමවේදය විවේචනය කරති. කෙසේනමුත් තබ්ලීග් ජමාතයේ සැබෑ මතවාදය තුළ මළගිය මුස්ලිම් සාන්තුවරුන් ඇදහීමට කිසිඳු ඉඩක් නැත. මේ හේතුව නිසා තබ්ලීග් ජමාතයටද "වහාබිවරුන්" යයි සම්ප්‍රදායික මුස්ලිම්වරුන් පවසති.

මුහම්මද් ඉබ්නු අබ්දුල් වහාබ් නැමති ශාස්ත්‍රඥයා දේශනා කලාක් මෙන් සොහොන් වන්දනාව හා මළවුන් ඇදහීම තබ්ලීග් ජමාතය ප්‍රතික්ෂේප කළද ඔහු දේවධර්මය හා නීතිවේදය සඳහා ගත් ප්‍රවේශය තබ්ලීග් ජමාතය පිළිගන්නේ නැත.

මුස්ලිම් කාන්තාවන් මුහුණ ආවරණය කිරීම පිළිබඳව මොවුන් දරන්නේ එය අනිවාර්ය වේ යන මතයයි. කෙසේනමුත් රටක පවතින ආරක්ෂක හේතුන් මත කාන්තාවන්ට මුහුණ නිරාවරණය කළ හැකි බව මොවුන් අවධාරණය කරති.

ශ්‍රී ලාංකීය තබ්ලිග් ජමාතය දේශපාලනයට වැඩි සැලකිල්ලක් දක්වන්නේ නැති අතර අනෙකුත් දේශපාලන දෘෂ්ටි පිළිබඳවද නිහඬ පිළිවෙතක් අනුගමනය කරති.

තබ්ලීග් ජමාතයේ මූලස්ථානය ලෙස ක්‍රියා කරන Markez Islamic Center (මර්කස් ඉස්ලාමීය මධ්‍යස්ථානය) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 1999 අංක 19 දරණ පනත මගින් සංස්ථාගත කර තිබේ.

# ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි SLJI

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන තවත් ඉහළ පෙළේ ප්‍රතිසංස්කරණවාදී සංවිධානයක් වනුයේ ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානයයි. මුස්ලිම් සමාජයේ ප්‍රතිසංස්කරණය ඉස්ලාමීය අධිරාජ්‍ය ස්ථාපිත කිරීම සඳහා විය යුතු බව පවසමින් පකිස්තානයේ අබුල් ආලා මෞදූදී නම් ශාස්ත්‍රඥයා විසින් ජමාතේ ඉස්ලාමී සංවිධානය පාකිස්තානයේදී මුල් වරට ස්ථාපිත කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදය ඇතුළු සියලු දේශපාලන දෘෂ්ටීන් ප්‍රතික්ෂේප කළ මව්ලානා මෞදූදී තුමා ඉස්ලාමීය දේශපාලන දෘෂ්ටිය සමාජ ප්‍රතිසංස්කරණය සඳහා වූ එකම විසඳුම බව දේශනා කළේය.

පකිස්තානු ජමාතේ ඉස්ලාමී සංවිධානයේ මතවාදය අනුගමනය කරමින් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය ක්‍රි.ව 1954දී පමණ ශ්‍රී ලංකාවේ ස්ථාපිත විය. ඊජිප්තුවේ හසනුල් බන්නා විසින් 1928 දී ස්ථාපිත කළ ඉඛ්වානුල් මුස්ලිමීන් (මුස්ලිම් සහෝදරත්වය) නමැති සංවිධානයේ මතවාද හා ඉස්ලාමීය නොවන දේශපාලන ක්‍රම වලට විරුද්ධ විය යුතුය යන සෙය්යිද් කුතුබ් නම් ශාස්ත්‍රඥයාගේ අදහස් වලට ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය ආරම්භ කාලයේදී ඇලුම් කළේය [6]. කෙසේනමුත් මෞලානා මෞදූදී, හසනුල් බන්නා, සෙය්යිද් කුතුබ් යන අයගේ අදහස් ලාංකීය දේශපාලන ක්‍රමය වන ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල නොවන නිසා ඔවුන්ගේ දේශපාලන මතවාද න්‍යායාත්මකව පිළිගත්තද ප්‍රායෝගික තලයේදී ඒවා යටපත් කරමින් ඉස්ලාමයේ අනෙකුත් අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලාංකාවේ ජමාතේ ඉස්ලාමී සංවිධානය කටයුතු කරයි. එනම් ලාංකීය දේශපාලන ක්‍රමයට අනුගත වීමක් ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමි සංවිධානය තුළ දැක ගත හැකිය [7]. මෙම සංවිධානය ද මුස්ලිම් ආගමික හා සංස්කෘතිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංවිධානයකි (MRCA/13/6/CO/04). මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇති අතර මොවුන්ට අනුබද්ධිත ආයතන රට පුරා ක්‍රියාත්මක වේ. මොවුන් සතුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා හසුරවන විද්වත් පිරිසක් සිටින අතර සිංහල බසින් ඉස්ලාමීය පොත් පත් ප්‍රකාශයට පත් කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත.

මොවුන් දේවධර්ම ගුරු කුල අතුරින් මූලික වශයෙන් අශ්අරී දේවධර්ම ගුරු කුලය පිළිගන්නා අතර නීතිවේදය යන විෂයේදී එක් ගුරු කුලයකට සීමා වී නැත. මුස්ලිම් ජනයා අතර සමඟිය ඇති කිරීම මොවුන්ගේ ප්‍රධාන තේමාව වී ඇත. එබැවින් මුස්ලිම් සමාජයේ පවතින මතභේදාත්මක කරුණු සාකච්ඡා කිරීමෙන් මොවුන් බොහෝ විට වැලකී සිටිති.

මොවුන්ද මලගිය සාන්තුවරුන් ඇදහීම මෙන්ම අනෙකුත් සාම්ප්‍රදායික ඇදහිලි ක්‍රම ප්‍රතික්ෂේප කරන බැවින් මොවුන්ටද වහාබිවරුන් යයි සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් පවසති. කෙසේනමුත් දේවධර්මය යන විෂයේදී බහුතරයක් සාමාජිකයින් මුහම්මද් ඉබ්නු අබ්දුල් වහාබ් තුමා දේශනා කළ දේව ධර්මය ඔවුන් පිළිගන්නේ නැත.

මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන මට්ටම ප්‍රවර්ධනය කිරීම සඳහා ජමාතේ ඉස්ලාමී සංවිධානය දැඩි ප්‍රයත්නයක් දරා ඇති අතර ඒ හේතුව නිසා උගත් මුස්ලිම්වරුන් පිරිසක් බිහි කිරීමට මෙම සංවිධානය හේතු වී ඇත. කාන්තාවන්ගේ අධ්‍යාපනය පිළිබඳ දැඩි සැලකිල්ලක් දක්වන මොවුන් ඔවුන්ගේ අධ්‍යාපනික ප්‍රවර්ධනය සඳහා කටයුතු කරති. කාන්තාවන්ගේ මුහුණ ආවරණය පිලිබඳ විෂයේදී එය අනිවාර්ය නොවන බව ඔවුන්ගේ අදහස් තුළින් පෙනෙන්නට තිබේ.

අනෙකුත් මුස්ලිම් සංවිධාන වලට සාපේක්ෂව දේශපාලනය යන විෂයට දැඩි ඇල්මක් ජමාතේ ඉස්ලාමී සංවිධානයට ඇත. ඒ බව මොවුන්ගේ පොත් පත්, සඟරා වල ඉදිරිපත් වන අදහස් වලින් පැහැදිලි වේ.

අල් හසනාත් යනු ජමාතේ ඉස්ලාමී සංවිධානය මඟින් දෙමළ බසින් ප්‍රකාශයට පත් කරන ප්‍රධාන සඟරාවකි. ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ GPOQD/132/News/2019 යන අංකයෙන්ද ලංකා ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ISSN 1391-460X යන අංකයෙන්ද ලියාපදිංචි කරනු ලබා මුද්‍රණය කරනු ලබන නීත්‍යානුකූල සඟරාවකි. මෙම සඟරාවට අමතරව 1984 සිට ප්‍රබෝධය නම් සිංහළ බසින් සඟරාවක් (www.prabodaya.lk) ඔවුන් ප්‍රකාශයට පත් කරන අතර මෙය ඉස්ලාමය සිංහලෙන් පැහැදිලි කරන ඉතා වැදගත් සඟරාවකි. මෙම සඟරා දෙකට අමතරව එංගල් දේසම් (අපේ දේශය) හා අහරම් යන දෙමළ සඟරා දෙකක්ද ට්‍රෙන්ඩ් නම් ඉංග්‍රීසි සඟරාවක්ද ප්‍රකාශයට පත්කරයි.

ජමාතේ ඉස්ලාමී සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව විශාල වශයෙන් සමාජ සේවා වල යෙදී සිටින සංවිධානයකි.

# සමස්ත ලංකා තව්හීද් ජමාතය ACTJ

මෙම සංවිධානය ස්ථාපිත කරන ලද්දේ ක්‍රි.ව 1970 දී නිසාර් කුවති නැමැත්තා විසිනි. ඒ වන තෙක් තව්හීද් මතවාදය දේශනා කිරීම සඳහා දායක වූයේ JASM සංවිධානයයි. නමුත් JASM හි ක්‍රියාකාරීත්වය කොළඹ ප්‍රදේශයේ ප්‍රචලිතව නොතිබුණු බැවින් පළමුව කොළඹ පෙදෙසේ ACTJ සංවිධානය ස්ථාපිත කරන ලදී. මෙම සංවිධානය මුස්ලිම් ආගමික හා සංස්කෘතිය කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි සංවිධානයකි (MRCA/13/6/CO/33). මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යාලය අංක 23, පාසල් පාර, දෙමටගොඩ, කොළඹ 09 යන ස්ථානයේ පිහිටා ඇති අතර මෙම සංවිධානය රට පුරා විවිධ ස්ථාන වල ශාඛා පිහිටුවාගෙන කටයුතු කරති.

ACTJ සංවිධානය හා එවකට ක්‍රියාත්මක වෙමින් තිබුණු JASM සංවිධානය යන දෙකම ආගමික මතවාදයෙන් හිත මිත්‍රකම් පැවැත්වූ සංවිධාන දෙකකි. කෙසේනමුත් JASM සංවිධානයට වඩා ACTJ සංවිධානය ඉතා ක්‍රියාකාරී සංවිධානයක් ලෙස කටයුතු කරති.

ACTJ සංවිධානය විසින් මුල් කාලයේදී වාන්සුඩර් නැමති සඟරාවක් දෙමළ බසින් ප්‍රකාශයට පත් කර ඇත. සත්තිය කුරල් (සත්‍ය හඬ) යනු ACTJ විසින් වර්තමානයයේදී දෙමළ බසින් ප්‍රකාශයට පත් කරන මාසික සඟරාවයි. මෙම සඟරාව 2001 වන වර්ශයේ සිට ප්‍රකාශයට පත් වන අතර ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ QD/147/News/2018 යන අංකයෙන් ලියාපදිංචි වී ඇත.

ACTJ සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව විශාල වශයෙන් සමාජ සේවා වලද යෙදී සිටින සංවිධානයකි. මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.actj.lk) තුළින් දැන ගත හැකිය.

# ශ්‍රී ලංකා තෞහීද් ජමාතය SLTJ

මෙම සංවිධානය ක්‍රි.ව 2005 දී පිහිටුවන ලදී. මේ සඳහා හේතු වූයේ ඉන්දියාවේ TNTJ නමැති සංවිධානය ස්ථාපිත කල පී.සේය්නුල් ආබ්දීන් නම් විද්වතාගේ මතවාදයන්ය. එම මතවාදයන් හා ඔවුගේ පරිපාලන ක්‍රමවේදයන් වලට ඇලුම් කල තෞව්හීද් මත දරන්නන් SLTJ නම් සංවිධානය ලංකාවේ ස්ථාපිත කළහ. මුල් කාලයේදී SLTJ හා TNTJ අතර තිබුණේ මතවාදී හිත මිත්‍රකමක් පමණි. පසුව ක්‍රි.ව 2010 දී SLTJ සංවිධානය TNTJ හි ශ්‍රී ලංකා ශාඛාව බවට පත් විය. SLTJ සංවිධානය මුස්ලිම් ආගමික හා සංස්කෘතිය කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි සංවිධානයකි (MRCA/13/6/CO/92). මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යාලය අංක 241A, සද්ධර්ම මාවත, මාලිගාවත්ත, කොළඹ 10 යන ස්ථානයේ පිහිටා ඇති අතර මොවුන්ගේ ශාඛා ලංකාව පුරාම විසිරි ඇත.

SLTJ අනෙකුත් තොව්හීද් ජමාතයෙන් වෙන් වන්නේ ෂ.සේය්නුල් ආබ්දීන් විද්වතා ප්‍රසිද්ධියට පත් කළ විප්ලවකාරී මතයක් නිසාය. එනම් හූනියම සත්‍යයක් බවත් ඉන් මිනිසාට බලපෑමක් කළහැකි බව කෙනෙකු පිළිගන්නේ නම් ඔහු මුස්ලිම් නොවන බවත් ඔහුගේ නායකත්වය යටතේ නැමදුම් කල නොහැකි බවත් දේශනා කිරීමට පටන් ගත්තේය. තවද හදීස් (මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම්) හි නිවැරදි හදීස් කුමක්ද යන්න විශ්ලේෂණය කිරීමේදී එහි අදහස අල් කුර්ආනයට පටහැනි නොවිය යුතුයි යයිද දේශනා කළේය. තවද ඉජ්මා ලෙස හැඳින්වෙන ප්‍රධාන ප්‍රවාහයේ මතයන් ඇතැම් විට ප්‍රතික්ෂේප කරති.

මෙම සංවිධාන එතෙක් පැවති තෞහීද් සංවිධාන වල පවතින සලෆි මතවාදයේ දේවධර්මය පිළිගත්තද සලෆිමතවාදයට අනුව ධර්මය අවබෝධ කරගන්නා ක්‍රමවේදයට දැඩි ලෙස විරුද්ධය. එනම් ඉස්ලාම් ධර්මය මුහම්මද් තුමාගෙන් පසු පැමිණි පරම්පරා තුනට අනුව තේරුම් ගැනීම දුර්මාර්ගයක් යයි මොවුන් පවසති. මොවුන් සෞදී අරාබියානු විද්වතුන්ට ප්‍රමුඛත්වයක් දෙන්නේ නැත. අරාබි දේශපාලන ක්‍රමයට දැඩි ලෙස විරුද්ධ වෙති. විදේශ ආයතන වලින් ආධාර ලබා ගැනීම ප්‍රතිපත්තියක් ලෙස ප්‍රතික්ෂේප කරති.

මේ හේතුව නිසා SLTJ අනෙකුත් තොව්හීද් ජමාත් වලින් මුළුමනින්ම වෙන් වී ගියහ. අනෙකුත් තෞහීද් පල්ලි වලට නොයති. එහි සිටින විද්වතුන්ගේ නායකත්වය යටතේ නමදුම් නොකරති. මෙනිසා ඔවුන්ට වෙනම පල්ලි සෑදීමට කටයුතු කර ඇති අතර එලෙස පල්ලි නොමැති අවස්ථාවලදී නිවෙස්වල, කුඩා කාමරවල තම නැමදුම් කරගෙන යති.

ලංකාවේ දැනට පවතින මුස්ලිම් නීතිය තුළින් මුස්ලිම් කාන්තාවන්ට යම් යම් අසාධාරණකම් සිදු වන බවත් එබැවින් එම මුස්ලිම් පනත සංශෝධනය විය යුතු බවත් මොවුන් අවධාරණය කරති. කාන්තාවන් මුහුණ වැසීම තහනම් කටයුත්තක් බව මොවුන් පවසති.

ලංකාව තුළ ක්‍රියාත්මක වන ෂරියා බැංකු ක්‍රමය ඉස්ලාමීය මූලාක්‍රමයට පටහැනි බැවින් එම ක්‍රමයට මොවුන් දැඩි ලෙස විරුද්ධ වෙති.

ලංකාවේ ක්‍රියාත්මක වන ප්‍රජාතන්ත්‍රවාදය න්‍යායාත්මකව පවා SLTJ සංවිධානය ප්‍රතික්ෂේප නොකරන අතර මුස්ලිම් ජනයා ප්‍රජාතන්ත්‍රවාදයට අනුව කටයුතු කළ යුතු බව පවසති. කෙසේනමුත් දේශපාලනයට ඍජුව සම්බන්ධ වීම මොවුන් ප්‍රතික්ෂේප කරති.

මොවුන් දෙමළ බසින් "අලෙෙපු" (කැඳවීම) නම් මාසික සඟරාව ප්‍රකාශයට පත් කරති. මෙම සඟරාව 2005 වසරේදී ආරම්භ කර ඇති අතර ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ QS/74/News/2014 යන අංකයෙන්ද ලංකා ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ISSN 1391-7501 යන අංකයෙන්ද ලියාපදිංචි කරනු ලැබ මුද්‍රණය කරනු ලබන නීත්‍යානුකූල සඟරාවකි. "අලෙෙපු" සඟරාවට අමතරව සිංහල බසින් "සත්යෝදය" නම් සඟරාවක්ද අවස්ථා කිහිපයකදී ප්‍රකාශයට පත් කර ඇත.

සිංහල බසින් ඉස්ලාම් ධර්මය පිලිබඳ නොයෙකුත් දේශන පවත්වන අතර සිංහල බසින් ඉස්ලාමීය ඉගැන්වීම් පිලිබඳ සමාජය දැනුවත් කිරීම සඳහා www.sathyodaya.org යන වෙබ් අඩවිය පවත්වාගෙන යති.

SLTJ සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව විශාල වශයෙන් සමාජ සේවා වල යෙදී සිටින සංවිධානයකි. ලේ දන් දීමේ කඳවුරු පැවැත්වීම තුළින් වැඩිම රුධිර පරිත්‍යාගයක් කළ සංවිධානය ලෙස වසර කිහිපයකදීම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රාජ්‍ය සම්මාන දිනා ගැනීමට මොවුන් සමත් වී ඇත. මොවුන්ගේ සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.sltj.lk) තුළින් දැන ගත හැකිය.

# ජමාතුස් සලාමා

ජමාතුස් සලාමා යනු ජමාතේ ඉස්ලාමි සංවිධානයෙන් බිඳුණු සංවිධානයක් ලෙස පැවසිය හැකිය. මෙය මූලික වශයෙන් ජමාතේ ඉස්ලාමි සංවිධානයේ පරිපාලනමය ක්‍රමවේදය පිළිබඳ ඇති මතබේද නිසා වෙන් වී ඇත. මෙහි ප්‍රාරම්භය 1980දි පමණ සිදු වී ඇත. ජමාතුස් සලාමා සංවිධානය ආගමික ප්‍රවර්ධන කටයුතු හා සමාජ සේවා වල යෙදී සිටින සංවිධානයකි. මොවුන් සිංහල බසින් ඉස්ලාම් ධර්මය පිළිබඳව ජනයා දැනුවත් කිරීමට වැඩි උනන්දුවක් දක්වති. මෙම සංවිධානයද මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත (MRCA/13/6/CO/89). මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යාලය අංක 1A, හිල් කාසල් පෙදෙස, බණ්ඩාරනායක මාවත කොළඹ 12 යන ස්ථානයේ පිහිටා ඇත.

මෙම සංවිධානය 1995 වසරේදී "මීල්පාර්වෙයි" (නැවත බැලීම) නම් මාසික සඟරාව දෙමළ බසින් ආරම්භ කළ අතර සමාජ වෙනසක් උදෙසා ප්‍රගතිශීලී මුස්ලිම් සමාජයක් බිහි කිරීම හා දේශපාලනය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම සඟරාවේ අරමුණ විය. කෙසේනමුත් 2015 වසරේදී මෙම සඟරාවේ ප්‍රකාශන අයිතිය වෙනත් ආයනයකට පැවරිණ.

ජමාතුස් සලාමා සංවිධානයේ සංවිධාන කටයුතු පිලිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.salamah.lk) තුලින් දැන ගත හැකිය.

# ජාතික තව්හීද් ජමාතය (NTJ)

මෙම සංවිධානය ස්ථාපිත කරන ලද්දේ සහ්රාන් හාෂිම් නමැති මුස්ලිම් දේශකයා විසිනි. පළමුව දාරුල් අතර් නම් සංවිධානයක සාමාජිකයෙක් ලෙස සිටි මොහු සුළු මතබේදයක් නිසා එම සංවිධානයෙන් ඉවත් වී ජාතික තව්හීද් ජමාතය නම් සංවිධානය පිහිටුවා ගත්තේය. මෙම සංවිධානය අනෙකුත් තව්හීද් ජමාත් අනුගමනය කරන දේවවේදය හා නීතිවේදය අනුගමනය කළහ. නමුත් පසුකාලීනව ඉන්දියාවේ ක්‍රියාත්මක වන TNTJ සංවිධානය දේශනා කළ අයුරින්ම හූනියම් ශාස්ත්‍රය අසත්‍ය බව පැවසූහ. හූනියම සත්‍යයක් බවත් ඉන් මිනිසාට බලපෑමක් කළහැකි බව කෙනෙකු පිළිගන්නේ නම් ඔහු මුස්ලිම් නොවන බවත් ඔහුගේ නායකත්වය යටතේ නැමදුම් කල නොහැකි බවත් දේශනා කිරීමට පටන් ගත්හ. තවද හදීස් (මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම්) හි නිවැරදි හදීස් කුමක්ද යන්න විශ්ලේෂණය කිරීමේදී එහි අදහස අල් කුරානයට පටහැනි නොවිය යුතුයි යයිද දේශනා කළේය. කෙසේනමුත් පසුව TNTJ සංවිධානයේ මතවාදය වැරදි බව ප්‍රසිද්ධියට පත් කර ප්‍රධාන ප්‍රවාහයේ තව්හීද් මතවාදයන් කරා පෙරලා පැමිණියහ.

NTJ සංවිධානයේ ආගමික ව්‍යාපාරයේ මූලික කටයුත්තක් වූයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ අබ්දුර් රවුෆ් කණ්ඩායමේ මතවාදය බිඳ දැමීම ය. මෙම මතවාදී අරගලය ක්‍රමයෙන් ප්‍රචණ්ඩත්වය කරා පරිවර්තනය විය. මෙනිසා වසර 2017 දී NTJ සාමාජිකයන් හා අබ්දුර් රවුෆ් කණ්ඩායමේ සමාජිකයන් අතර විශාල ගැටුමක් ඇති විය [8]. මේ ගැටලුව හේතුවෙන් සහ්රාන් නැමැත්තා පලා ගොස් කැලයක සැඟවී තම දේශනා රහසිගතව කිරීමට පටන් ගත්තේය. පසුව සහ්රාන් ක්‍රමයෙන් ISIS ත්‍රස්ත සංවිධානයේ මතවාදයට ආකර්ෂණය වී එම මතවාදය දේශනා කිරීමට පටන් ගත්තේය. එබැවින් ඔහුව NTJ සංවිධානයෙන් නෙරපා දමා ඇත. අවසානයේදී ISIS ත්‍රස්ත සංවිධානයට සම්බන්ධ ජමාතේ මිල්ලතු ඉබ්‍රාහීම් (JMI ) සංවිධානය සමඟ සම්බන්ධ වී විලායත් අස් සීලානි (WAS) නම් ISIS හි ලාංකීය නියෝජනය බිහි කර ගෙන 2019 අප්‍රේල් 21 බෝම්බ ප්‍රහාරයන් දියත් කළේය. මේ හේතුව නිසා NTJ, JMI හා WAS යන සංවිධාන තුනම ලංකාවේ තහනම් කරන ලදී [9].

සහ්රාන් කණ්ඩායමේ ත්‍රස්ත ක්‍රියාවන් වලට හේතුව “වහාබ්වාදය” වන බව ඇතැමුන් සිතති. කෙසේනමුත් සහ්රාන් කණ්ඩායම අබ්දුල් වහාබ් තුමා දේශනා කළ දේවධර්මය හා නීතිවේදය අනුගමන කළද දේශපාලනමය වශයෙන් වෙනස්ම මතයක් දරයි. මුස්ලිම් නොවන රාජ්‍යයන්ට එරෙහිව කටයුතු කළ යුතු බව මොවුන් පවසති. ISIS නායකයාට අවනත නොවන්නන් මුස්ලිම් නොවන්නන් බවද මොවුන් පවසති. එබැවින් මොවුන් හැඳින්වීමට තක්ෆීරි (අන් අය අවිශ්වාසකරුවන් කරන්නා වූ) ජමාත් යන නම භාවිතා වේ.

NTJ සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව සමාජ සේවා වලද යෙදී සිටි සංවිධානයකි. මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.ntjweb.com) තුළින් දැන ගත හැකිය.

# එක්සත් තව්හීද් ජමාතය (UTJ)

මෙම සංවිධානය 2016 ඔක්තෝබර් මස 15 වන දින අබ්දුල් වදූද් ජිෆ්රි නම් මෞලවිවරයාගේ නායකත්ව යටතේ පිහටුවන ලදී. මෙම සංවිධානය පිහිටුවන ලද්දේ ලංකාව තුළ බෙදී පවතින සියලු තව්හීද් ජමාතයන් එක් ධජයක් යටතට ගෙන තව්හීද් ජමාතයන් සඳහා එක නියෝජනයක් ගෙන ඒම සඳහාය. නමුත් මොවුන්ගේ වෑයම 100% සාර්ථක වී නොමැත. මෙම සංවිධානය ස්ථාපිත කරන මොහොතේ ක්‍රියාකරමින් සිටි ඉහළ පෙළේ තව්හීද් සංවිධාන මෙම සංවිධානය යටතේ ක්‍රියාත්මක වීමට මැලි වූහ. නමුත් රටපුරා විසිර ගොස් තිබුණ තව්හීද් මතවාදය දරන ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාකල සංවිධාන සියල්ලක්ම පාහේ එක්සේසත් කිරීමට මෙම සංවිධානයට හැකි වී ඇත. UTJ සංවිධානය ස්ථාපිත කිරීමේදී පැවති SLTJ සංවිධානය හා පසුව ස්ථාපිත කළ CTJ සංවිධානය යන සංවිධාන දෙක UTJ සංවිධානයේ සාමාජිකත්වය දරන්නේ නැත. මෙයට හේතුව SLTJ,CTJ යන සංවිධාන දෙක හා අනෙකුත් තව්හීද් ජමාත් අතර පවතින කිසිඳු අයුරකින් එකඟත්වයකට එළඹිය නොහැකි ආගමික මතවාදය යි.

UTJ සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව සමාජ සේවා වලද යෙදී සිටින සංවිධානයකි. මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.unitedtj.com) තුළින් දැන ගත හැකිය.

# සිලෝන් තව්හීද් ජමාතය (CTJ)

ඉන්දියාවේ TNTJ නැමති සංවිධානය ස්ථාපිත කළ පී. සේයිනුල් ආබ්දීන් නමැති විද්වතා පිළිබඳ 2019 වසරේදී TNTJ සංවිධානයේ පරිපාලන කමිටුව විසින් සිදු කළ විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් එම විද්වතාව එම සංවිධානයෙන් ඉවත් කරන ලදී. මෙම තීරණයට විරුද්ධ වූ TNTJ සංවිධානයේ ශාඛාවක් ලෙස කටයුතු කළ ලංකාවේ ක්‍රියාත්මක වූ SLTJ සංවිධානයේ සමාජිකත්වය දැරූ මූලික දේශකයන් කිහිප දෙනෙක් SLTJ සංවිධානයෙන් වෙන් වී CTJ සංවිධානය පිහිටුවා ගත්හ. ලංකාවේ ව්‍යාප්තව තිබූ SLTJ සංවිධානයේ ශාඛා අතුරින් ඇතැම් ශාඛා CTJ සංවිධානයට ඒකාබද්ධ වූහ. SLTJ හා CTJ සංවිධානය අතර ඇත්තේ පරිපාලනමය මත භේදයක් වන අතර සංවිධාන දෙකෙහිම ආගමික මතවාදය එක හා සමානය. TNTJ සංවිධානයෙන් ඉවත් කරන ලද පී. සේයිනුල් ආබ්දීන් නම් විද්වතා NTF (නැශනල් තව්හීද් ෆෙඩරේශන්) නම් නව සංවිධානයක් ස්ථාපිත කල අතර ලංකාවේ ස්ථාපිත කරන ලද CTJ සංවිධානය ඉන්දියාවේ NTF සංවිධානයත් සමඟ මතවාදීව හිත මිත්‍රකම් පවත්වති.

සිංහල බසින් ඉස්ලාම් ධර්මය පිළිබඳ විවිධ දේශන පවත්වති. තවද සිංහල බසින් ඉස්ලාමීය ඉගැන්වීම් පිළිබඳ සමාජය දැනුවත් කිරීම සඳහා www.pradeepaya.com යන වෙබ් අඩවිය පවත්වාගෙන යති.

CTJ සංවිධානය ආගමික ව්‍යාපාරයට අමතරව සමාජ සේවා වලද යෙදී සිටින සංවිධානයකි. මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.ceylontj.com) තුළින් දැන ගත හැකිය.

# සමස්ත ලංකා සලෆි කවුන්සිලය (ACSC)

මෙම සංවිධානය ස්ථාපිත කරන ලද්දේ මුහම්මද් නුබා යහ්යා සිලිම් නම් ශාස්ත්‍රඥයා විසිනි. මෙම සංවිධානය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇත (GA2070). නිවැරදි දේවධර්මය හා ඉස්ලාමීය නීතිවේදය වෙත මුස්ලිම් ජනයා අරාධනා කිරීම මොවුන්ගේ ප්‍රධාන කාර්යභාරයයි. මොවුන් ලංකාව තුළ මූලිකවශයෙන් ඉංග්‍රීසි බසින් ක්‍රියාත්මක වන අතර දෙමළ බසින්ද යම්තාක් දුරට ක්‍රියාත්මක වේ.

මොවුන්ගේ මතවාදය හා JASM මතවාදය අතර සමානකම් තිබෙන බව මතුපිටින් දක්නට ලැබුණද ගැඹුරින් බැලීමේදී සුවිශේෂී වෙනස්කම් කිහිපයක් දැක ගත හැකිය. ධර්මය අවබෝධය සඳහා මුහම්මද් ﷺ තුමාගෙන් පසු පැමිණි පරම්පරා තුනේ තොරතුරු දැඩි ලෙස උපයෝගී කර ගනිති. තවද ධර්මය දේශනා කිරීමට නම් අනිවාර්යයෙන්ම සුදුසු ඉස්ලාමීය විද්වතෙකුගෙන් ධර්මය නිසි ලෙස ඉගෙන ගෙන ධර්මය දේශනා කිරීම සඳහා එම විද්වතාගෙන් අනුමැතියද (ඉජාසා) ලබා තිබිය යුතු බව මොවුන් පවසති. මේ අනුව මෙම "ඉජාසා" සම්ප්‍රදාය මුහම්මද් ﷺ තුමා තෙක් වැල නොකැඩී යා යුතු බව මොවුන් අවධාරණය කරති. එබැවින් මෙලෙස තෝරාගත් විද්වත් පිරිසක් පමණක් මොවුන් අනුමත කරන අතර අන් අයගෙන් දැනුම ලබා ගැනීම සුදුසු නොමැති බව පවසති. මේ අනුව මොවුන් JASM විද්වතුන්ට හෝ අනෙකුත් මුස්ලිම් සංවිධාන වල විද්වතුන්ට පිළිගැනීමක් ලබා දෙන්නේ නැත.

කාන්තාවන් මුහුණ ආවරණය කිරීම අනිවාර්ය බව මොවුන් පවසති. දේශපාලනයට මොවුන් නැඹුරු නොවෙති. මොවුන් හැඳින්වීමටද "වහාබිවරුන්" යන නම සාම්ප්‍රදායික/සූෆි මුස්ලිම්වරුන් භාවිතා කරති. යම් සුළු මතභේද නිසා මොවුන්ගෙන් වෙන්වී ගිය පිරිස්ද සිටිති.

මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.darsalaf.net) තුළින් දැන ගත හැකිය.

# ජමාතුල් මුස්ලිමීන්

JASM සංවිධානය හා අනුබද්ධ අස් සලෆියා අරාබි විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස කටයුතු කළ උමර් අලි නැමැත්තා ඉස්ලාම් ධර්මය තුළ පවතින බය්යත් නම් ඉගැන්වීම (නායකයාට ප්‍රතිඥා දීම) පදනම් කර ගනිමින් ඔහු සියලුම මුස්ලිම්වරුන්ගේ නායකයා බවත් එබැවින් සියලු මුස්ලිම්වරුන් ඔහුට බය්යත් කළ යුතු බවත් පැවසුවේය. එසේ නොකරන්නා මුස්ලිම් නොවන්නෙක් බවත් පැවසුවේය. ක්‍රි.ව 1970 දී පමණ පකිස්තානයට ගිය මොහු 1976 දී ජමාතුල් මුස්ලිමීන් සංවිධානය ස්ථාපිත කළේය. මෙම සංවිධානයද මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇත (MRCA/13/6/TM/16). ප්‍රධාන කාර්යාලය අංශය - 3, පුල්මුඩයි නම් ස්ථානයේ පිහිටා ඇත.

සැබෑ මුස්ලිම්වරයෙකු වීමට නම් මුස්ලිම් නායකයාට යටත්ව කටයුතු කරන බවට ප්‍රතිඥා දිය යුතු බවත් එම නායකයා මෙම සංවිධානයේ නායකයා බවත් දේශනා කිරීම මෙම සංවිධානයේ ප්‍රධාන තේමාවයි. ජමාතුල් මුස්ලිමීන් සංවිධානයේ හා ISIS සංවිධානයේ මතවාදය අතර සමානකමක් මතුපිටින් බලන විට පෙනෙනමුත් මෙම සංවිධාන දෙක අතර කැපීපෙනෙන වෙනසක් ඇත. එනම් ජමාතුල් මුස්ලිමීන් සංවිධානයේ  මතවාදයට අනුව එහි නායකයා හුදෙක් ආධ්‍යාත්මික නායකයෙක් ලෙස පමණක් කටයුතු කරයි. නමුත් ISIS සංවිධානයේ නායකයා අධිරාජ්‍යවාදියෙක් ලෙස කටයුතු කරයි.

කාන්තාවන් මුහුණ ආවරණය කළ යුතු බව මොවුන් අවධාරණය කරති. අවනත විය යුත්තේ දෙවිඳුන්ට පමණක් බව මොවුන් මුල් කාලයේදී දේශනා කළහ. මේ නිසා ලාංකීය රජය විසින් පනවන නීතීන්ටද යටත් නොවිය යුතු බව මොවුන් පැවසූහ. එනිසා හැඳුනුම්පත්, වාහන ලියාපදිංචි සහතික යනාදිය ලබා ගැනීමද ප්‍රතික්ෂේප කළහ. පසුව මෙම මතයේ තිබුණු ප්‍රයෝගික ගැටළු නිසා මෙම මතයෙන් ප්‍රයෝගික තලයෙන් බැහැර වී ඇත.

මුල් කාලයේදී විශාල පිරිසක් මෙම සංවිධානයට සම්බන්ධ වූ අතර 1993 වසරේ ඉන්දියාවේ ක්‍රියාත්මක වූ TNTJ සංවිධානය හා මෙම සංවිධානය අතර සිදු වූ ප්‍රසිද්ධ විවාදයෙන් පසු ජමාතුල් මුස්ලිමීන් සංවිධානය ක්‍රමයෙන් පරිහානියට ලක් විය. අවසානයේ ජමාතුල් මුස්ලිමීන් සංවිධානයද දෙකට කැඩී ගොස් ඇති අතර, දැන් ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන් අඩාල වී ඇත. වර්තමානයේදී මෙම මතදාරීන් උමර් අලි නමැත්තාගේ පදිංචි ස්ථානය වන එතාලය නම් ගමට මූලික වශයෙන් සීමා වී ඇති අතර රටේ විවිධ ගම් වල සැලකිය නොහැකි තරම් ඉතා කුඩා පිරිස් ජීවත් වෙති.

මෙම සංවිධානය ඔවුන්ගේ මතවාද සමාජ ගත කිරීම සඳහා තෙලිවූ (නිරවුල්) යන දෙමළ සඟරාව ක්‍රි.ව 2008 වන තෙක් එළි දැක්වූහ.

මොවුන්ගේ සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.jamaathulmuslimeen.com) තුළින් දැන ගත හැකිය.

# සමස්ථ ලංකා තරීකතුල් මුෆ්ලිහීන්

සමස්ථ ලංකා තරීකතුල් මුෆ්ලිහීන් යනු සූෆි මුස්ලිම් කණ්ඩායමකි. මෙම කණ්ඩායම පටන් ගෙන ඇත්තේ M.S.M අබ්දුල්ලාහ් නමැති ආධ්‍යාත්මික නායකයෙකු විසිනි. මොහු පයිල්වාන් (මල්ලව පොර ශූරයා) යන නමින් ප්‍රචලිතය. ඔහු මරදමුන නම් පෙදෙසේ ජීවත් වූ අයෙකි. සමස්ථ ලංකා තරීකතුල් මුෆ්ලිහීන් සංවිධානය සංස්කෘතික සමිතියක් ලෙස 1989 ජනවාරි පළමු දින මඩකලපුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. මොවුන්ගේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත්තේ කාත්තන්කුඩි ප්‍රදේශයේය.

මොවුන්ගේ ප්‍රධානතම ඉගැන්වීම දෙවිඳුන්ගේ සර්වව්‍යාප්තියයි. එනම් දෙවිඳුන් සියලුම තන්හි සිටින අර්ථයයි. ඔවුන් පවසන්නේ අල්ලාහ් හැර වෙන කිසිවක් නැති බවය. මෙහි දාර්ශනික අර්ථය පවතින සියල්ලම දෙවිඳුන් යන්නයි. ”වහ්දතුල් වුජූද්” (සියල්ල ඔහුය). මොවුන් ඉස්ලාමීය නැමදුම් ක්‍රමයට සැලකිල්ලක් දක්වන්නේ නැත ඔවුන් දෙවිඳුන් යැදීම සඳහා යම් යම් ගීතිකා නිර්මාණය කර ඇත.

මොවුන්ගේ මතයට දැඩි විරෝධයක් එවකට මුස්ලිම් සමාජයෙන් පැමිණි අතර ක්‍රමයෙන් සාමාජිකයන් ගණන අඩු වී ඇත. කෙසේනමුත් දැනටත් මෙම මතවාදය අනුගමනය කරන පිරිසක් ලංකාවේ මෙන්ම විදේශ රටවල සිටිති.

මොහු මියගිය පසු මොහුගේ දේහය කාත්තන්කුඩි ප්‍රදේශයේ ඔවුන්ගේ ප්‍රධාන දේවස්ථානය තුළ තැන්පත් කර සොහොන් කොතක් තනා ඇත. ඔහුගේ බිරිඳගේ දේහයද ඒ අසල ඒ අයුරින්ම තැන්පත් කර ඇත. කෙසේනමුත් පයිල්වාන්ගේ මතවාදයට විරුද්ධ ප්‍රදේශවාසීන් පයිල්වාන්ගේ මෘතදේහය එම ස්ථානයෙන් ඉවත් කර දැමූ බව ඇතැමුන් පවසති.

මොවුන්ගේ සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.mufliheen.org) තුළින් දැන ගත හැකිය.

# අබ්දුර් රවුෆ් කණ්ඩායම

අබ්දුර් රවුෆ් යනු අල්ලාහ් සර්වව්‍යාප්ත වේ යන මතය දේශනා කරන පුද්ගලයකි. මොහු මෙම මතවාදය දේශනා කිරීම 1979 වසරේදී ආරම්භ කර ඇත. පවතින සියලු දේ අල්ලාහ් බවත් ඒ අනුව තමාද අල්ලාහ් යන මතය මොහු සමාජගත කළ අතර මොහුගේ මතවාදය අනුගමනය කරන පිරිසක් ක්‍රමයෙන් බිහි වී ඇත. මෙම පිරිස හැඳින්වීමට අබ්දුර් රවුෆ් කණ්ඩායම යන නම මෙම මතවාදයට විරුද්ධ වන්නන් භාවිතා කරති.

අබ්දුර් රවුෆ් නැමැත්තා දෙවිඳුන් යයි ඇතැමුන් විශ්වාස කරන අතර "වාප්පා නායකම්" (පිය උතුමාණෝ) යන නමින්ද හඳුන්වති. මොහුගේ ඡායාරූප ඇතැමුන්ගේ ගෙවල් වලද එල්ලා ඇත. තරීකතුල් මුෆ්ලිහීන් සංවිධානයේ නිර්මාතෘ M.S.M අබ්දුල්ලාහ් (පයිල්වාන්) හා අබ්දුර් රවුෆ් යන දෙදෙනාම අල්ලාහ් සර්වව්‍යාප්ත වේ යන මතය දේශනා කළද M.S.M අබ්දුල්ලාහ් (පයිල්වාන්) ඉස්ලාමීය නැමදුම් ක්‍රමය ප්‍රතික්ෂේප කළ මෙන් අබ්දුර් රවුෆ් ඉස්ලාමීය නැමදුම් ක්‍රමයට විරුද්ධ වූයේ නැත. තවද මිය ගිය මුස්ලිම් සාන්තුවරුන්ගෙන් පිහිට පැතීම අනුමත කරමින් අබ්දුර් රවුෆ් තම මතවාදය දේශනා කළේය. එබැවින් සාම්ප්‍රදායික මුස්ලිම්වරුන් M.S.M අබ්දුල්ලාහ්ගේ මතවාදයට විරුද්ධත්වය පෑවද අබ්දුර් රවුෆ්ගේ යම් යම් කරුණු අනුමත කිරීමක් දක්නට ලැබේ.

කෙසේනමුත් අබ්දුර් රවුෆ් කණ්ඩායමේ මතවාදය අනෙකුත් මුස්ලිම් සංවිධාන දැඩි ලෙස ප්‍රතික්ෂේප කරති. අබ්දුර් රවුෆ් කණ්ඩායමේ මතවාදය වැරදි බවත් මෙම මතවාදය පිළිපදින්නන් මුස්ලිම්වරුන් නොවන බවත් සමස්ත ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය කිහිපවතාවක්ම නිවේදන නිකුත් කර ඇත. කෙසේනමුත් අබ්දුර් රවුෆ් කණ්ඩායමේ මතවලට දැඩි ලෙස විරුද්ධව කතා කර ඇත්තේ කාත්තන්කුඩි ප්‍රදේශයේ එවකට තිබූ NTJ සංවිධානය ස්ථාපිත කළ සහ්රාන් නම් දේශකයාය.

අබ්දුර් රවුෆ් යනු මෙම වාර්ථාව සකසන මොහොතේද ජීවතුන් අතර සිටින පුද්ගලයෙකි. අබ්දුර් රවුෆ් කණ්ඩායමේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු www.shumsmedia.com නැමති වෙබ් අඩවිය තුළින් දැන ගත හැකිය.

# ක්වාරිජ්වරුන්

ක්වාරිජ්වරුන් යනු ප්‍රධාන ප්‍රවාහයෙන් පිටත්ව අන්තවාදී ලෙස කටයුතු කරන පිරිසකි. මෙම මතවාදයේ මුල් ලක්ෂණ මුහම්මද් ﷺ තුමාගේ කාලයේදීම එක් පුද්ගලයෙකු තුළ හට ගත් බවට සාක්ෂි තිබේ. සධාරණත්වයේ උපරිමයෙන් කටයුතු කළ මුහම්මද් ﷺ තුමා වෙත පැමිණි පුද්ගලයෙක් මුහම්මද් ﷺ තුමාගේ ක්‍රියාකාරීත්වයට නොසතුට පාමින් සාධාරණව කටයුතු කරන මෙන් මුහම්මද් ﷺ තුමාට අණ කර පිටව ගියේය. ආගමික නායකත්වයට පවා ඉහලින් යන ස්වභාවයක් මොහු සතුව තිබුණු බව දුටු මුහම්මද් ﷺ තුමා මෙම මතවාදය දරන අඥාන පිරිසක් සෑම කාල වකවානුවකදීම ඉස්මතු වී ක්‍රමයෙන් විනාශයට පත් වන බවත් මෙම පිරිස ඉස්ලාම් ධර්මය අනුගමනය කරන බව පැවසුවද සැබෑ ඉස්ලාම් ධර්මයේ පිහිටන්නන් නොවන බවත් පවසුවේ ය.

මුහම්මද් ﷺ තුමාණන්ගේ අභාවයෙන් පසු රාජ්‍ය නායකත්වය ක්‍රමයයෙන් "අබූබක්කර් (රළි), "උමර්" (රළි), "උස්මාන්" (රළි). අලි (රළි) යන අයට හිමි විය. අලි (රළි) තුමාට රාජ්‍ය පාලනය හිමිවන්නේ තෙවන පාලකයා වන උස්මාන් (රළි) තුමාව කුමන්ත්‍රණකාරි පිරිසක් විසින් ඝාතනයට ලක්වීමෙන් පසුවය. මෙම ඝාතනයට වගකිව යුත්තන් සෙවීමට අලි (රළි) දැක්වූ උදාසීන ප්‍රතිචාර හේතු කොටගෙන සිරියාවේ ආණ්ඩුකාර ලෙස සිටි මුආවියා (රළි) තුමා තම බල ප්‍රදේශය අලි (රළි) තුමාගේ පාලනයෙන් ඉවත් කොට වෙනම රාජ්‍යයක් ලෙස පවත්වාගෙන යන්නට තීන්දු කළේය. නමුත් අලි (රළි) තුමා මුආවියා (රළි) තුමාට පවසා සිටියේ රාජ්‍ය නායකත්වයට යටත්ව ක්‍රියා කරන ලෙසය. මෙලෙස එතෙක් ඒකීය රාජ්‍යයක් ලෙස පැවතී මුස්ලිම්වරුන් ප්‍රථම වතාවට දෙකඩ වී ගිය අතර මෙම තත්වය දෙපිරිස අතර යුද්ධයක් ඇති වීමට හේතු විය. මෙලෙස හට ගත් යුද්ධයට දෙපිරිසම කැමැත්තක් නොදැක්වූ නිසා අවසානයේ සමාදානයට පැමිණියහ. කෙසේනමුත් මෙම සාමදානයට අලි (රළි) තුමාගේ පාර්ශවයේ පිරිසක් කැමැත්ත දැක්වූයේ නැත. මෙම පිරිස අලි (රළි) තුමාගේ නායකත්වය ප්‍රතික්ෂේප කර වෙන්ව ගොස් තනි රාජ්‍යයක් පිහිටුවා ගත් අතර මොවුන් ධර්මයේ විවිධ කරුණු විකෘති කර දැමූහ. මොවුන් තුළ තිබුණේ ලේ පිපාසයකි. මෙම පිරිස ප්‍රධාන ප්‍රවාහයෙන් පිටත් වූවන් නිසා ක්වාරිජ්වරුන් (පිටවූවන්) ලෙස මුස්ලිම් විද්වතුන් හැඳින්වූහ. මුහම්මද් ﷺ තුමා අනාවැකි පළ කළ පිරිස මොවුන්ය. අලි (රළි) තුමාගේ කාලයේදී මොවුන් විවාදයෙන් හා යුධමය වශයෙන් පරාජයට පත් කළද මුහම්මද් ﷺ තුමා පැවසූ පරිදිම මෙම මතවාදය දරන්නන් කලින් කලට මතු වේ.

ISIS යනු මෑත ඉතිහාසයේ බිහි වූ කුරිරුතම ක්වාරිජ්වරුන් පිරිසකි. ISIS මතවාදය පිළිගත් ලංකාවේ බිහි වූ පළමු පිරිස නිලාම් කණ්ඩායම වන අතර ඔවුන් ISIS හි යුධ කලාපය වූ සිරියාවට සංක්‍රමණය වූහ. පසුව ISIS අඩිපාරේ JMI (ජමාතේ මිල්ලතු ඉබ්‍රාහීම්)සංවිධානය, සහ්රාන් කණ්ඩායම හා ඔවුන් දෙපිරිස එක්ව සැදූ විලායත් සීලානි නම් සංවිධාන බිහි වූ අතර මේ සියල්ල ලංකාවේ තහනම් සංවිධාන ලෙස නම් කර ඇත. [10].

(රළි) : රළියල්ලාහු අන්හු (ඔවුන් පිළිබඳව අල්ලාහ් තෘප්තියට පත් වේවා !)

# ෂියාවරුන්

මුහම්මද් ﷺ තුමාගෙන් පසු සිව්වන රාජ්‍ය පාලනය හිමි වූයේ අලි (රළි) තුමාටය. මෙතුමාට රාජ්‍ය පාලනය හිමිවන්නේ තෙවන පාලකයා වන උස්මාන් (රළි) තුමාව කුමන්ත්‍රණකාරි පිරිසක් විසින් ඝාතනයට ලක්වීමෙන් පසුවය. මෙම ඝාතනයට වගකිව යුත්තන් සෙවීමට අලි (රළි) තුමා දැක්වූ උදාසීන ප්‍රතිචාර හේතු කොටගෙන සිරියාවේ ආණ්ඩුකාර ලෙස සිටි මුආවියා (රළි) තුමා හා අලි (රළි) තුමා අතර විරසකයක් ඇති වූ අතර මේ නිසා මුස්ලිම් සමාජය දෙකඩ වී ගියේය. පසුව මෙම බෙදීම සාම ගිවිසුමක් තුළින් සමතයකට පත් කරන ලදී. මෙසේ කල්ගෙවෙද්දී අලි (රළි) තුමා ද ඉබ්නුල් මුල්ජිම් නැමැත්තෙකු මඟින් ඝාතනයට ලක්වන අතර එතුමාගේ රාජ්‍ය බලය එතුමාගේ වැඩිමහල් පුතා වන හසන් (රළි) තුමාට හිමි විය. ඔහු තම පියා මඟින් උරුම වූ රාජ්‍ය පාලනය මුවාවියා (රළි) තුමාට භාර කරමින් මෙතෙක් දෙකඩ වී පැවති මුස්ලිම් සමාජය යලිත් ඒකීය සමාජයක් බවට පත් කිරීම සඳහා ප්‍රායෝගික පියවරක් ගත්තේය.

මුආවියා (රළි) තුමාට රාජ්‍ය පාලනය හිමි වීම පිළිබඳව "අබ්දුල්ලාහ් බින් සබා" නැමැත්තා ඇතුළු ඔහුගේ කණ්ඩායම සතුටට පත් නොවූහ. මුහම්මද් ﷺ තුමාට පසුව මුස්ලිම්වරුන්ගේ නායකත්වය අලි (රළි) තුමාට යා යුතුව තිබුණු බවත් එසේ නොදී අන් අය එම තනතුර උදුරා ගත් බවත් මොවුන් පැවසූහ. එසේ තිබියදී අලි (රළි) තුමාගේ පවුලේ කෙනෙකුට රාජ්‍ය පාලනය හිමි වූ පසු එය නැවත අලි (රළි) තුමාගේ පරපුරෙන් පිටත කෙනෙකුට ලබා දීම වැරදි තීරණයක් බව පැවසූහ. මෙලෙස විරුද්ධ මතවාද වර්ධනය වන අතරතුර රටේ ජනාධිපති මුආවියා (රළි) තුමා අභාවයට පත්වන අතර ඉන් අනතුරුව එතුමාගේ පුත් "යෙසීද්" වෙත එම රාජ්‍ය බලය හිමි විය. මෙම කාලයේදී කුමන්ත්‍රණකාරි පිරිසක් විසින් හසන් (රළි) තුමාගේ සහෝදරයා වන හුසෙයින් (රළි) තුමාවද ඝාතනය කරන ලදී. මේ අතරතුර තවත් පසෙකින් මේ සියල්ලට නායකත්වය ලබාදෙන අබ්දුල්ලා බින් සබා ජනතාව අතර අලුත් මතවාදයක්ද වපුරන්නට විය. එනම් අලි (රළි) තුමා මියගිය නොමැති බවත් එතුමාව දෙවියන් අහසට ඔසවාගෙන ඇති බවත් යලි ඔහු මෙලොවට පහලවෙන බවත් අබ්දුල්ලා බින් සබා දේශනා කරන්නට විය. ඒ අනුව මෙතෙක් මුස්ලිම්වරුන් අතර පැවති දේශපාලන ගැටුම අබ්දුල්ලා බින් සබාගේ නායකත්වය යටතේ අලුත් ආගමික මත ගැටුමක් බවට පරිවර්ථනය වන්නට විය. මෙලෙස අලි (රළි) තුමාට හා ඔහුගේ පවුලේ ඥාතීන්ට ප්‍රමුඛත්වයක් දෙමින් ෂියාවරුන් යැයි පොදුවේ හඳුන්වනු ලබන අලි ෂියා (අලිගේ කණ්ඩායම) බිහි වී ඇත. ෂියාවරුන් අතරද පසුකාලීනව විවිධ ආගමික මතවාද මුල් කරගෙන විවිධ නිකායන් බිහිවී ඇත.

ලංකාවේ ෂියාවරුන් සිටින්නේ ඉතා සුළු වශයෙනි. මඩකලපුවේ ඔට්ටමාවාඩිහි ෂියා ප්‍රජාවක් ජීවත් වන අතර හඳුනාගත නොහැකි අයුරින් ලංකාවේ අනෙකුත් ප්‍රදේශ වලද ජීවත් වෙති. ව්‍යාපාර සඳහා ලංකාවට පැමිණි පදිංචි වූ බෝරාවරුන් ෂියාවරුන්ගේ කොටසකි.

(රළි) : රලියල්ලාහු අන්හු (ඔවුන් පිළිබඳව අල්ලාහ් තෘප්තියට පත් වේවා !)

# කාදියානිවරුන්

1835 වසරේ පෙබරවාරි 13 වන දින ඉන්දියාවේ උපත ලද මිර්සා ගුලාම් අහමද් නැමැත්තා තමා මුහම්මද් ﷺ තුමාට පසු පැමිණි දේව පණිවුඩකරුවෙකු ලෙස ජනයාට හඳුන්වා දුන් අතර මෙය පිළිගෙන ඔහුව අනුගමනය කළ පිරිසක් බිහිවිය. මිර්සා ගුලාම් නම් පුද්ගලයා ඉන්දියාවේ "කාදියාන්" නම් පෙදෙසේ ජීවත් වූ බැවින් මිර්සා ගුලාම් නැමැත්තාව දේව පණිවුඩකරුවෙකු බව පිළිගෙන ඔහුව අනුගමනය කරන්නන් හැඳින්වීමට කාදියානිවරුන් යයි භාවිතා වේ.

ඇතැමුන් මිර්සා ගුලාම් අහමද් යනු දේව පණිවුඩකරුවෙකු නොව ප්‍රතිසංස්කරණවාදියෙක් පමණක් බව විශ්වාස කරති. එබැවින් මිර්සා ගුලාම් අහමද් නැමැත්තාව දේව පණිවුඩකරුවෙකු යැයි පිළිගන්නා පිරිස හැඳින්වීමට "කාදියානි" යන වචනයත්, මිර්සා ගුලාම් අහමද් නැමැත්තාව හුදෙක් ප්‍රතිසංස්කරණවාදියෙක් යැයි පිළිගන්නා පිරිස හැඳින්වීමට "අහ්මදියා" යන නමත් ශාස්ත්‍රීය තලයේ භාවිතා කරනු ලැබේ. නමුත් "අහ්මදියා", "කාදියානි" යන නම් දෙකම බොහෝ විට සමාජයේ භාවිතා වන්නේ මිර්සා ගුලාම් අහමද් නැමැත්තාව දේව පණිවුඩකරුවෙකු යැයි පිළිගන්නා පිරිස හැඳින්වීමට ය.

ඉන්දියාවේ බිහි වූ මෙම කාදියානුවරුන්ගෙන් සුළු පිරිසක් 19 වන සියවසේදී ලංකාවට සංක්‍රමණය වී ඇති අතර ඔවුන්ගේ මතවාදය ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා අහ්මදියා මුස්ලිම් ජමාතය යන සංවිධානය පිහිටුවාගෙන ඇත. මෙහි මූලස්ථානය කොළඹ දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටා ඇත. මෙම සංවිධානයේ ක්‍රියාකාරකම් ඔවුන්ගේ අන්තර්ජාතික නිල වෙබ් අඩවිය (www.alislam.org) තුළින් දැන ගත හැක.

අවසාන දේව පණිවුඩකරුවා මුහම්මද් ﷺ තුමා බව ඉස්ලාමීය මූලාශ්‍ර වල පැහැදිලිව සඳහන් නිසා මුහම්මද් ﷺ තුමාට පසුව පැමිණි මිර්සා ගුලාම් අහමද් නැමැත්තාව දේව පණිවුඩකරුවෙකු යැයි පිළිගන්නා කාදියානිවරුන් මුස්ලිම්වරුන් නොවන බව අනෙකුත් මුස්ලිම් සංවිධාන වල ස්ථාවරයයි.


ලංකාවේ මුස්ලිම් කණ්ඩායම්
සුන්නි මුස්ලිම්වරු
ෂියාවරු
කාදියානිවරු
සාම්ප්‍රදායික මුස්ලිම්වරු
ප්‍රතිසංස්කරණවාදී සංවිධාන
හුදකලා කණ්ඩායම්
කවාරිජ්වරුන්
තරීකාවරුන්
තක්කියාවරුන්
චිස්තියා
කාදිරිය්යා
ශාතුලීයා
රිෆායියා
නක්ෂබන්දියා
ජමාතුල් මුස්ලිමීන්
තරීකතුල් මුෆ්ලිහීන්
අබ්දුර් රවුෆ් කණ්ඩායම
සහ්රාන් කණ්ඩායම
ජමාතේ මිල්ලතු ඉබ්රාහීම් JMI
නිලාම් කණ්ඩායම
විලායත් අස් සීලානි
තෞහීද් සංවිධාන
තබ්ලීග් ජමාතය
ඉස්ලාමීය දේශපාලන ක්‍රමය මත පදනම් සංවිධාන
ප්‍රධාන ප්‍රවාහයේ තෞහීද් සංවිධාන
නවීකරණය වූ තෞහීද් සංවිධාන
හුදකලා තෞහීද් සංවිධාන
හුදකලා සලෆි සංවිධාන
ශ්‍රී ලංකා ජමාතේ ඉස්ලාමී සංවිධානය SLJI
ජමාතුස් සාලාමා සංවිධානය
ශ්‍රී ලංකා තෞහීද් ජමාතය SLTJ
සිලොන් තෞහීද් ජමාතය CTJ
ජාතික තෞහීද් ජමාතය NTJ
සමස්ථ ලංකා සලෆි කවුන්සිලය ACSC
ජමාතුල් අන්සාර් සුන්නතුල් මුහම්මදියා JASM
සමස්ථ ලංකා තෞහීද් ජමාතය ACTJ
එක්සත් තෞහීද් ජමාතය UTJ
අනෙකුත් තෞහීද් සංවිධාන

# සමස්ත ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය ACJU

සමස්ත ලංකා මුස්ලිම් වියතුන්ගේ සංගමය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සුප්‍රසිද්ධ මුස්ලිම් සංවිධානයකි. මෙම සංවිධානයේ මූලික අරමුණ ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ මුස්ලිම් සංවිධාන නියෝජනය කරන මුස්ලිම් විද්වතුන් සියල්ල එක් ධජයක් යටතට ගෙන ඒම හා සියලු ශ්‍රී ලාංකීය මුස්ලිම්වරුන්ට ආගමික නායකත්වය දීම ය. ලංකාවේ අති බහුතරයක් මුස්ලිම් විද්වතුන් මෙම සංවිධානයේ සාමාජිකත්ව දරති. මෙම සංවිධානය ක්‍රි.ව 1924 දී ස්ථාපිත කර ඇති අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ 2000 අංක 51 දරණ පනත මගින් සංස්ථාගත කර තිබේ. වර්තමානයේදී මොවුන්ගේ ශාඛාවන් ලංකාවේ විවිධ පෙදෙස් වලට ව්‍යාප්ත වී ඇත.

ඉස්ලාම් ධර්මය ප්‍රවර්ධනය කිරීම, මුස්ලිම් විද්වතුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම, ආගමික තීන්දු (ෆත්වා) ප්‍රකාශයට පත් කිරීම මුස්ලිම් හා මුස්ලිම් නොවන ජනයා අතර සහජීවනය ඇති කිරීම යනාදී කර්තව්‍යයන් රාශියක් මෙම සංවිධානය යටතේ සිදු වේ. මෙම සංවිධානය සමස්ත ලාංකික මුස්ලිම්වරුන්ට නායකත්වය දෙන සංවිධානයක් ලෙස ප්‍රචලිත වුවද සාම්ප්‍රදායික මතවාද මත ගොඩනැගුණු මුස්ලිම් සංවිධාන, SLTJ හා CTJ යන සංවිධාන ACJU සංවිධානයේ මතවාද වලට එකඟ නොවන අතර ඔවුන්ගේ පාලනයෙන් තොරව ක්‍රියාත්මක වේ.

මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.acju.lk) තුළින් දැන ගත හැකිය.

# ජාතික ශූරා කවුන්සිලය (NSC)

ජාතික ශූරා කවුන්සිලය (NSC) යනු ලංකාවේ ක්‍රියාත්මක වන මුස්ලිම් සංවිධාන හා මුස්ලිම් සමාජීය ක්‍රියාකාරීන්ගේ එකමුතුවකි. මෙම සංවිධානය 2013 වසරේදී ස්ථාපිත කරන ලද අතර මෙම සංවිධානය සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇත (GA3109).

ලාංකීය මුස්ලිම් සමාජයට එරෙහිව සිදු වන විවිධ කටයුතු සඳහා ප්‍රජාතාන්ත්‍රික රාමුව තුළ සාර්ථක විසඳුම් ලබා ගැනීමේ අරමුණින් මෙම සංවිධානය පිහිටුවා ඇත. මුස්ලිම් ජනයාගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම හා මුස්ලිම් සමාජයට එරෙහිව එල්ල වන අභියෝග වලට මුහුණ දිය යුතු අකාරය පිළිබඳව මුස්ලිම් ජනයා දැනුවත් කිරීම මෙම සංවිධානයේ ප්‍රධාන කාර්යයකි.

තවද ශ්‍රී ලංකාව තුළ ජාතීන් අතර සාමය හා සංහිඳියාව ඇති කිරීම සඳහා දැඩි ලෙස මෙම සංවිධානය කටයුතු කරයි. මුස්ලිම්වරුන් හා මුස්ලිම් නොවන්නන් අතර පවතින සමාජීය අන්තර් ක්‍රියාවන් වලදී පැන නැඟී ඇති ගැටළු පිළිබඳ වැඩි සැලකිල්ලක් මෙම සංවිධානයට ඇති අතර එම ගැටළු නිරාකරණය කිරීමට දැඩි ලෙස කටයුතු කරති. පවතින ගැටළු සඳහා විසඳුම් සෙවීම පමණක් නොව අනාගතයේද ගැටළු ඇති වීම වැලක්වීමට කටයුතු කිරීම මෙම සංවිධානයේ ප්‍රධාන අරමුණක් වේ.

මෙම සංවිධානයේ සංවිධාන කටයුතු පිළිබඳ තොරතුරු ඔවුන්ගේ නිල වෙබ් අඩවිය (www.nationalshoora.com) තුළින් දැන ගත හැකිය.

# සමාප්තිය

ලාංකීය මුස්ලිම් ප්‍රජාව මූලික වශයෙන් සම්ප්‍රදායික මුස්ලිම්වරු, ප්‍රතිසංස්කරණවාදී ආගමික-සමාජීය ව්‍යාපාර හා සම්බන්ධ මුස්ලිම්වරු හා හුදකලා වූ ආගමික කණ්ඩායම් ලෙස කොටස් තුනකට වෙන් වී සිටිති. මේ අතුරින් වත්මන් මුස්ලිම් සමාජය ප්‍රතිසංස්කරණවාදී ආගමික-සමාජීය ව්‍යාපාර වල මතවාද වලට වැඩියෙන් නැඹුරු වී ඇති අතර එම ව්‍යාපාර සමඟ නිල වශයෙන් හෝ නිල නොවන අයුරින් සම්බන්ධකම් පවත්වති.

ප්‍රතිසංස්කරණවාදී ආගමික-සමාජීය ව්‍යාපාර නිසා මුස්ලිම් ප්‍රජාව ක්‍රමයෙන් සාම්ප්‍රදායික ඉගැන්වීම් වලින් බැහැර වී ආගමික මූලාශ්‍ර පදනම් කරගනිමින් ශාස්ත්‍රීය ක්‍රමවේදයක් තුළින් ඉස්ලාමය අවබෝධ කරගැනීමටත් අනුගමනය කිරීමටත් නැඹුරු වී ඇත. මෙලෙස ලාංකීය මුස්ලිම් සමාජය තුළ ඉස්ලාම් ධර්මය අනුගමනය කිරීමේ ප්‍රවනතාවයක් ඇති වී තිබෙන නිසා ලාංකීය මුස්ලිම් සමාජයේ වෙනස්කම් රාශියක් හටගෙන තිබේ. මෙම වෙනස්කම් බොහෝමයක් දේවධර්මය හා නීතිවේදය යන ක්ෂේත්‍ර වල සිදුවී ඇති නිසා එම වෙනස්කම් මුස්ලිම් නොවන සමාජයට විනිවිද නොවේ. කෙසේනමුත් ලාංකීය මුස්ලිම් සමාජයේ ඇති වූ වෙනස්කම් කිහිපයක් මුස්ලිම් නොවන සමාජය ඉදිරියේ කැපී පෙනෙන්නට ඇත. මූලික වශයෙන් මුස්ලිම් වස්ත්‍රය, මුස්ලිම්වරුන් සඳහා විශේෂ වූ මූල්‍යකරන ක්‍රම සමාජයේ ක්‍රියාත්මක වීම. මුස්ලිම්වරුන්ගේ අවශ්‍යතාවය මත හලාල් සහතිකය ඇතුළත් ආහාර වෙළඳ පොළට එක් වීම සැලකිය හැකි ය. මීට අමතරව මුස්ලිම් පල්ලි ව්‍යාප්තිය, ආගමික පාසල් බිහිවීම, ලාංකීය මුස්ලිම් හා දික්කසාද පනතට වැඩි සැලකිල්ලක් දැක්වීම යනාදියද ලාංකීය සමාජයේ දැඩි ලෙස කතිකාවට ලක් වන මාතෘකා වේ.

ලාංකීය මුස්ලිම් සමාජයේ සිදු වූ වෙනසට සමගාමීව ලාංකීය බහුතර ජනයා බටහිර සම්ප්‍රදායන් අනුකරණය කිරීම තීව්‍ර වී ඇති බැවින් මුස්ලිම් ප්‍රජාව හා බහුතර ජනයා අතර ඇති පරතරය සීඝ්‍ර ලෙස වැඩි වී ඇත. මෙම පරතරය ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් සංස්කෘතිමය ආක්‍රමණයක් සිදු වී ඇත යන සමාජ මතය බිහි වීමට හේතු වී තිබේ. සැබවින්ම සිදුව ඇත්තේ මුස්ලිම් සංස්කෘතිමය ආක්‍රමණයක් නොව සංස්කෘතීන් අතර පරතරය තීව්‍ර ලෙස වැඩි වීම ය.

මුස්ලිම් සමාජයේ සිදු වී ඇති ප්‍රතිසංස්කරණය න්‍යායාත්මකව ශ්‍රී ලාංකීය අගයන් වලට පටහැනි නොවේ. කෙසේනමුත් වර්ථමානයේ ඇති වී තිබෙන සංස්කෘතිමය පරතරය නිසා මුස්ලිම් නොවන ලාංකීය බහුතර ජනයා හා ලාංකීය මුස්ලිම් ජනයා අතර යම් ආකාරයක විරසකයක් ගොඩ නැඟෙමින් පවතියි. මේ සඳහා ප්‍රායෝගික විසඳුම් සෙවීම ලාංකීය අප සැමගේ වගකීමකි.

# උපග්‍රන්ථ අ : දේවධර්ම ගුරුකුල

දෙවිඳුන් පිළිබඳ අධ්‍යයනය ඉස්ලාමීය දේවධර්මය ලෙස හැඳින්වේ. මෙම විෂයේ විවිධ මතභේද මුස්ලිම් ඉතිහාසයේ ඇති වී තිබේ.

මෙම මතභේද අතුරින් දෙවිඳුන්ගේ නාමයන් හා ගුණාංගයන් පිළිබඳ අවබෝධය සුවිශේෂී ස්ථානයක් හිමි කර ගෙන ඇත. මුඃතසිලාවරුන් යයි හැඳින්වෙන කණ්ඩායම දෙවිඳුන්ගේ ගුණාංගයන් වචනාර්ථයෙන් තේරුම් නොගත යුතු බව දේශනා කළහ. මෙම ගුරුකුලය අනුගමනය කල අෂ්අරී නමැති ශාස්ත්‍රඥයා මෙම ගුරු කුලයෙන් ඉවත්ව දෙවිඳුන්ගේ ගුණාංග කිහිපයක් හැර අනෙක් ගුණාංග වචනාර්ථයෙන් තේරුම් නොගත යුතු බවත් ඒ සඳහා අර්ථකතන ලබා දිය යුතු බවත් පවසා ඇත. ඉමාම් අෂ්අරී නමැති ශාස්ත්‍රඥයා මෙන්ම මාතුරුදී නමැති ශාස්ත්‍රඥයා මේ හා සමාන දේවධර්ම මතවාදයක් දේශනා කර ඇත. මේ අනුව අෂ්අරී හා මාතුරුදී යන නමින් දේවධර්ම ගුරුකුල දෙක බිහි වී ඇත. මෙම ගුරුකුල දෙක අතර ඇත්තේ ඉතා සුළු වෙනස්කම් පමණි. මෙම ගුරුකුල නවක ගුරුකුල නිසා මෙම ගුරුකුල අනුගමනය කරන්නන් හලෆ්වරුන් (නවකයන්) ලෙස හැඳින්වේ. දෙවිඳුන්ගේ නම් හා ගුණාංගයන් සඳහා අර්ථකතන ලබා නොදිය යුතු බවත් ඒවා දේව නිර්මාණයන්ට ආදේශ නොකර දෙවිඳුන්ගේ ගෞරවයට සරිලන පරිදි වචනාර්ථයෙන්ම තේරුම් ගැනීම පැරණි මුතුන්මිත්තන්ගේ ක්‍රමය බව හලෆ්වරුන්ට විරුද්ධ වන්නන් පවසති. මෙලෙස නවක දේවධර්ම ගුරුකුල වලට විරුද්ධව මුතුන්මිත්තන්ගේ දේවධර්මය අනුගමනය කරන්නන් සලෆිවරුන් (මුතුන්මිත්තන්) ලෙස හැඳින්වේ. අෂ්අරී නම් ශාස්ත්‍රඥයා ද ඔහුගේ අවසාන කාලයේදී සලෆි දේවධර්මයට පිවිසුණු බව සලෆිවරුන් පවසති.

# උපග්‍රන්ථ ආ : නීතිවේද ගුරුකුල

මෙලොව ජීවිතයේ සෑම අංශයකදීම මිනිසා පිළිපැදිය යුතු ඉස්ලාමීය නීති රීති පිළිබඳව ගැඹුරු ලෙස අධ්‍යයනය කිරීම ඉස්ලාමීය නීතිවේදය යයි සලකනු ලැබේ. ඉස්ලාමීය නීති රීති සම්පාදනය සඳහා අල් කුර්ආනය හා අල් කුර්ආනයට සෘජු විවිරණයක් ලෙස කටයුතු කරන මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම් යන මූලාශ්‍ර දෙක භාවිතා වන අතර මෙම මූලාශ්‍ර දෙක උපයෝගී කර ගනිමින් යම් විෂයක් සඳහා වූ ඉස්ලාමීය නීතිය කුමක්ද යන්න තීරණය කිරීම සඳහා වැදගත් සාධක කිහිපයක් බලපානු ඇත. නිදසුනක් ලෙස යම් නීතියක් ගැන සඳහන් කුර්ආන් වැකියක හෝ මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීමක සඳහන් තීරණාත්මක වචනයකට හෝ වචන වලට අරාබි භාෂාවට අනුව ලබා දිය හැකි අර්ථය කුමක්ද? එලෙස සඳහන් නීතිය පසුව අනාවරණය වූ නව නීතියකින් අහෝසි වූවාද? පොදු නීතියක් සඳහා සහනශීලී විශේෂ අවස්ථා තිබෙනවාද? යනාදී සාධක බලපානු ලැබේ.

ඉහත සඳහන් ක්‍රමවේදය ඇසුරෙන් ඉස්ලාමීය නීති රීති විවිධ මාතෘකා යටතේ පෙළ ගැස්වූ සුපතල විද්වතුන් වනුයේ ඉමාම් ශාෆි, හනෆි, හන්බලි, මාලික් යන විද්වතුන් ය. ඔවුන්ගේ ප්‍රවේශය අනුව ඇතැම් විෂයන්හිදී මෙම නීතිවේදීන් අතර මතභේද හටගෙන ඇත. කෙසේනමුත් මෙම ශාස්ත්‍රඥයන් පවසා ඇත්තේ තමන්ගේ නිගමන අල් කුර්ආනයට හා මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම් වලට පටහැනි නම් ඔවුන්ගේ නිගමන අත්හැර දමා අල් කුර්ආනයට හා මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම් වලට ප්‍රමුඛත්වය දෙන ලෙසය.

ශාෆි, හනෆි, හන්බලි, මාලික් යන ශාස්ත්‍රඥයන් සතර දෙනාගේ නමින් ප්‍රධාන ඉස්ලාමීය නීතිවේද ගුරුකුල සතර බිහිවී ඇත. ඇතැම් මුස්ලිම්වරුන් මෙම ගුරුකුල අතුරින් එක් ගුරුකුලයකට පමණක් සීමා වී ඇති අතර එක් ගුරුකුලයකට සීමා නොවී අල් කුරානයට හා මුහම්මද් ﷺ තුමාගේ ඉගැන්වීම් වලට ප්‍රමුඛත්වය දී කටයුතු කරන මුස්ලිම්වරු ද සිටිති. යම් එක් ගුරුකුලයකට සීමා විය යුතුමද, උපරිම වශයෙන් ගුරු කුල සතරට පමණක් සීමාවිය යුතුද? එවන් සීමාවන් කිසිවක් නොමැතිද? යන්න මුස්ලිම් සමාජයේ අදටත් පවතින ප්‍රධාන මතභේදයකි.

# මූලාශ්‍ර

[1] ලෝනා දේවරාජ, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු, ලංකා ඉස්ලාමීය පදනම, 2008, පි 72
[2] එම, පි.73
[3] http://muslimaffairs.gov.lk/wp-content/uploads/2019/05/Associations-Copy.pdf
[4] http://jailani.org/mcgilvray.htm
[5] https://amazinglanka.com/wp/tomb-of-adam-and-eve/
[6] Dr. A.R.M. Imtiyaz, Ms. Minna Thaheer, Sri Lanka Jamaat-e-Islami (https://www.academia.edu/37633504/Title_Sri_Lanka_Jamaat-e-Islami_Affiliation)
[7] මොහමඩ් ෆස්ලාන් සහ නදීන් වන්නිසිංහම්, බිඳී යන ප්‍රජාව, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වන ජාත්‍යන්තර කේන්ද්‍රය, 2015, පි.17,18
[8] Muheed Jeeran, Sri Lanka bomb blasts: Knowing suicide bomber Zahran Hashim, https://theleaders-online.com/sri-lanka-bomb-blasts-knowing-suicide-bomber-zahran-hashim/
[9] http://www.documents.gov.lk/files/egz/2019/5/2123-02_S.pdf
[10] Prof Rohan Gunaratna, Sri Lanka at Cross Roads: Time to Learn, Unlearn and Relearn.
https://www.youtube.com/watch?v=lvSaRpYlbSk&t=2719s

තම ධර්මය භේද කොට විවිධ කණ්ඩායම් බවට පත් වූ අයගේ කිසිඳු කටයුත්තකට (මුහම්මද්) නුඹට සම්බන්ධයක් නැත. ඔවුන්ගේ විෂය අල්ලාහ් වෙතය. පසුව ඔවුන් කරමින් සිටි දේ ගැන ඔහු ඔවුනට දැනුම් දෙනු ඇත.

[අල් කුර්ආනය 6:159]

www.socialdialogues.org

ඉස්ලාමීය තොරතුරු හා ගවේෂණ පදනම
අංක 162/3 මැල්වත්ත, ඉළුක්වෙල, වැඋඩ, කුරුණෑගල, ශ්‍රී ලංකාව
වෙබ් ලිපිනය : www.iirf.lk
විද්‍යුත් තැපැල : info@iirf.lk
දුරකථන අංකය : +94 37 39 7576 4

ISBN 978-955-7933-13-9